ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජාගකොස)

ලිපිනය

241,

උද්‍යාන පාර,

කොළඹ 05.

වෙබ් අඩවිය

www.ntc.gov.lk

විද්‍යුත් තැපෑල

info@ntc.gov.lk

ක්ෂණික ඇමතුම්

1955

ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය,
7වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

වාර්ෂික වාර්තාව - 2022

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ අනුව සකස් කරන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහාවූ කාර්ය සාධන වාර්තාව, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ඉතාමත් සතුටින් ඉදිරිපත් කරමි.

ශෂී වෙල්ගම,
සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.

පටුන

		පරිච්ඡේදය	පිටුව
1.		**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**	04
	1.01	හැඳින්වීම	05
	1.02	අපගේ දැක්ම සහ මෙහෙවර	06
	1.03	අපගේ ඉලක්කය	06
	1.04	අපගේ අරමුණු	07
	1.05	අපගේ වටිනාකම්	08
	1.06	සභාපතිතුමාගේ පණිවිඩය	09
	1.07	කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය	11
	1.08	ජාතික කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	13
	1.09	කොමිෂන් සභාවේ සංයුතිය	14
2.		**2022 වර්ෂයේ කාර්යසාධන**	17
	2.01	සමාජයීය ශුභසාධනය ප්‍රමුඛ කොටගත් බස් සේවා සැපයීම	19
	2.02	බස් නැවතුම්පල නඩත්තු කිරීම හා බස් පර්යන්ත මෙහෙයුම්	24
	2.03	බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම	25
	2.04	ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ	26
	2.05	දුර ගමන් සේවා සීමිත නැවතුම් සංඥා පුවරු සවි කිරීම	28
	2.06	ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම	29
	2.07	බස් ගාස්තු සකස් කිරීම හා විෂමතා ඉවත් කිරීම	29
	2.08	පොදු ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්	30
	2.09	පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම	31
	2.10	බස්රථ සඳහා ජී.පී.එස්. (GPS) උපකරණ සවිකිරීම	33
	2.11	පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය (Electronic Fare Collection)	33
	2.12	ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව සකස් කිරීම	34
	2.13	නාගරික ප්‍රවාහනය සැලසුම් කිරීම	35
	2.14	ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය හා නවීකරණය	36
3.		**ව්‍යාපෘති නොවන කාර්යයන්**	**37**
4.		**වාර්ෂික ගිණුම්**	44
5.		**විගණකාධිපති වාර්තාව**	57



01.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

1.01 හැඳින්වීම.

බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, ආණ්ඩුවට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව ස්ථාපනය කර ඇත.
නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකුගෙන්ද එනම් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන,ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකුගෙන්; ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂය භාර අමාත්‍ය වරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිළධරයෙකුගෙන්; මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, අධ්‍යක්ෂවරයෙකුගේ නිලයට අඩු නොවන නිලයක වූ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිළධරයෙකුගෙන් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත ගරු ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයින් පස් දෙනෙකුගෙන්ද සමන්විත කොමිෂන් සභාව ඊට දී ඇති නාමයෙන් අවිච්චින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවකි.

උක්ත පනතින් පැවරී ඇති කර්තව්‍යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම්, ධාවන හා සේවා අධීක්ෂණ, තත්ත්ව ආරක්ෂණ සහ බාහිර සම්බන්ධතා, මුදල් හා ප්‍රසම්පාදන යන දෙපාර්තමේන්තු හතරක් සහ පාලන, අභ්‍යන්තර විගණක හා නීති යන අංශ 3ක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අතර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය අංක 241,උද්‍යාන පාර, කොළඹ 05 යන ලිපිනයේ පිහිටා ඇත. කොළඹ බැස්ටියන් මාවත අන්තර්පළාත් පෞද්ගලික බස්නැවතුම් අංගනය සහ වවුනියාව ප්‍රධාන බස් නැවතුම් අංගනය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ශාඛා කාර්යාල වශයෙන් ක්‍රියාත්මක වේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 224 වන අතර සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන දෙපාර්තමේන්තු 04 යටතේ කටයුතු කරන අධ්‍යක්ෂ වරුන් හතර දෙනෙකුගෙන් කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමන්විතවේ.

1.02 අපගේ දැක්ම සහ මෙහෙවර



අපගේ දැක්ම...

දිවයින තුළ සමාජ-ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ගුණාත්මක, පිරිවැය ඵලදායී සහ ආරක්ෂාකාරී ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් හා සේවාවක් මගින් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම විවිධ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සහතිකවීම.



අපගේ මෙහෙවර...

මගී ප්‍රවාහනයට අදාල ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ශ්‍රී ලංකා රජයට උපදෙස් දීම සහ පොදුජන ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම බස් ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතිකවීම සඳහා අවශ්‍ය නියාමන රාමුවක් සකස්කිරීම.

1.03 අපගේ ඉලක්කය

සුරක්ෂිත, සුවපහසුව, විශ්වාසනීය සහ සමාන අවස්ථා සහිතව සැමට පොදු ප්‍රවාහන සේවයට ප්‍රවේශ වීමට ඉඩ ප්‍රශස්ථ මට්ටමින් සැලසීම

Our Goal

Allow access to public transport service for all with ensured safe, comfort, reliable and equal opportunities at optimum level

1.04 අපගේ අරමුණු

- *විශ්වසනීය හා මිත්‍රශීලී පොදු මගී ප්‍රවාහන සේවාවක් දිවයින තුළ ස්ථාපිත කිරීම.*
- *අවම ප්‍රවාහන පහසුකම් සහිත හෝ ප්‍රවාහන පහසුකම් නොමැති ප්‍රදේශවල ජනතාවට පොදු මගී ප්‍රවාහන සේවා සැපයීම.*
- *නවීන තාක්ෂණය පදනම් කරගනිමින් සුහුරු ප්‍රවාහන සේවාවක් හඳුන්වා දීම.*
- *මගී ප්‍රවාහනයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.*
- *විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය පහසුකම් පොදු මගී ප්‍රවාහන සේවාව තුළ ස්ථාපිත කිරීම.*
- *විශ්වසනීය හා මිත්‍රශීලී මගී ප්‍රවාහන සේවා මෙන්ම භාණ්ඩ ප්‍රවාහන සේවා පහසුකම් ද පොදු මගී ප්‍රවාහන මාධ්‍ය තුළ සැපයීම.*
- *මගී ප්‍රවාහන සේවාව හා සම්බන්ධ මානව සම්පත් සංවර්ධනය.*
- *සෑම පුද්ගලයෙකුටම දැරිය හැකි ගාස්තු ක්‍රමයක් පොදු මගී ප්‍රවාහන සේවා සඳහා හඳුන්වා දීම.*
- *වාහන මඟින් සිදු වන පරිසර දූෂණය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.*
- *මාර්ග අනතුරු අවම කිරීම.*
- *සමාජ සුභසාධනය සඳහා අවශ්‍ය වන මගී ප්‍රවාහන සේවා සැපයීම.*

1.05 අපගේ වටිනාකම්



Teamwork – We collaborate to deliver results

(සාමූහිකත්වය /කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම - ප්‍රතිඵල ලබා දීමට අපි සහයෝගයෙන් කටයුතු කරන්නෙමු)

Resilience – We ready to recover from the troublous situations quickly

(සුනම්‍යබව /ප්‍රත්‍යාස්ථිතිය) - ගැටළුකාරී තත්ත්වයන් ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීමට අපි සූදානම්ව සිටිමු)

Integrity – We maintain the utmost level of honesty & integrity

(පරිපූර්ණබව/අඛණ්ඩතාව - අපි උපරිම මට්ටමේ අවංකභාවය සහ සත්‍යාගරුකභාවය අඛණ්ඩව පවත්වා ගනිමු)

Caring –We display kindness and concern for stakeholders

(රැකවරණය - අපි පාර්ශවකරුවන් කෙරෙහි කරුණාව සහ රැකවරණය ප්‍රදර්ශනය කරමු)

Excellence –We provide excellence performance in our deliverables

(විශිෂ්ටත්වය - අපි අපගේ සේවාවන් වලදී විශිෂ්ට කාර්ය සාධනයක් ලබා දෙන්නෙමු)

Progressive –We uphold innovative & conductive progress

(ප්‍රගතිශීලීබව - අපි නව්‍ය සහ ගතිකත්වයේ ප්‍රගතිය තහවුරු කරමු)

Safety –We ensure safe secure & healthy environment

(ආරක්ෂාව - අපි ආරක්ෂාකාරී සහ යහපත් පරිසරයක් සහතික කරමු)

1.06 සභාපතිතුමාගේ පණිවිඩය



සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ ක්‍රියාදාමය තුළ ප්‍රවාහනය වෙත පැවරී ඇත්තේ අද්විතීය කාර්යභාරයකි. කවර රටක වුවද ප්‍රවාහන ජාලයේ කාර්යක්ෂමතාවය, ආර්ථික සංවර්ධනය හා සමාජයීය අභිවෘද්ධිය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ පොදු බස් මගී ප්‍රවාහන පද්ධතිය විධිමත්, ගුණාත්මක හා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත කාර්යයන් සම්පාදනය කරමින් රටෙහි ප්‍රවාහන අවශ්‍යතා විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වගකීම වේ.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාව, එම පනත ප්‍රකාරව පැවරී ඇති කර්තව්‍යයන් වශයෙන්, බස්රථ මගින් මගී ප්‍රවාහන සේවාවන්ට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම ඇතුළුව එම ප්‍රතිපත්තිය කෙරෙහි සැළකිලිමත්ව, මහජනයාගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස පිළිගතහැකි තත්ත්වයෙන් යුත් බස්රථ සේවා පවතින්නේද යන්න අවලෝකනය කිරීම හා පවත්වාගෙන යා යුතු අවම මට්ටම තීරණය කිරීම, මගී ප්‍රවාහනය කිරීමට බස්රථ සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම, එසේ කිරීමේදී අදාල කොන්දේසි නියම කිරීම, එම කොන්දේසි ප්‍රකාරව ක්‍රියා කරන්නේද යන්න අවලෝකනය කිරීම, අවසරපත්‍ර සඳහා ගාස්තු නිර්ණය කිරීම යනාදී කර්තව්‍යයන් හා පාසල් සිසුන් සඳහා අනුග්‍රාහක ගාස්තු මත පාසල් සේවා සැලැස්වීම, ලාභ නොලබන මාර්ගවල බස්රථ සේවා සැලසෙන බවට වගබලා ගැනීම සහ එවැනි සේවා සලසන්නන්ට මූල්‍යාධාර සැලසීම, ගාස්තු නිර්ණය කිරීම ආදී කර්තව්‍යයන්ද අන්තර් පළාත් බස්රථ සේවා සැලසීම හා ඒ සම්බන්ධයෙන් මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම, බලයලත් නිලධාරීන් සඳහා අවශ්‍ය කළමනාකරණ විශේෂඥතා සහාය සහ බස්රථ සේවා සැලසීමට අදාල කර්තව්‍යයන් නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය හා උපදෙස් ලබා දීම යන කාර්යයන් ප්‍රධාන වේ.

උක්ත කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති රැසක් හඳුන්වා දී ඇත. ඒ අතරින් පාසල් සිසුන්ට මානසික හා කායික අපහසුතාවයන්ගෙන් තොරව කලට වේලාවට පාසලට යාමේ සහ ආරක්ෂාකාරීව ආපසු පැමිණීමේ පහසුකම් සැලසීම අරමුණු කර 'සිසු සැරිය' බස් රථ සේවාව, ප්‍රවාහන පහසුකම් නොමැති පෙදෙස් වල වෙසෙන ජනතාවට තම දෛනික අවශ්‍යතාවන් සඳහා 'ගැමි සැරිය' බස්රථ සේවාව, රාත්‍රී කාලයේ සහ හිමිදිරි උදෑසන බස් සේවාවල පවතින හිඟකම නිසා මගීන්ට මුහුණ පෑමට සිදුවන අපහසුතා මගහැරවීම සඳහා 'නිසි සැරිය' බස් සේවාව ආරම්භ කර ක්‍රියාත්මක කිරීම ප්‍රධාන තැනක් ගනී.

මීට අමතරව පොදු බස් මගී ප්‍රවාහන සේවයෙහි ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, බස් ගාස්තු අයකිරීමේදී සිදුකරන අක්‍රමිකතා

හා මගී මැසිවිලි අවම කිරීමට නවීන තාක්ෂණ ක්‍රමවේද අනුගමනය කරමින් පොදු මගී ප්‍රවාහන බස්රථ ගාස්තු ගෙවීම සඳහා ඉලෙක්ට්‍රොනික් කාඩ්පතක් හඳුන්වා දීමේ වැඩපිළිවෙල, බස්රථ ධාවකයින්ගේ ව්‍යාපාරික අපේක්ෂා සාර්ථක කරගත හැකි වන පරිදි සියලුම බස් ධාවකයින්ට සම අවස්ථා සැලසෙන පරිදි විද්‍යාත්මක ඒකාබද්ධ චක්‍රීය කාලසටහන් සකස් කිරීමේ ව්‍යාපෘතිය, ප්‍රවාහන අධිකාරින්හි කළමනාකාරිත්වය, අන්තර් පළාත් බස්රථ හිමිකරුවන්, පාසල් රථ නියාමක කණ්ඩායම් ඇතුළු මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන් ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය, කාර්යක්ෂම ලෙස බස් රථ නියාමනය කිරීමටත් මගී පැමිණිලි විමර්ෂණය හා තොරතුරු සැපයීමටත් GPS තාක්ෂණය යොදා ගනිමින් පොදු බස්රථ තුළ GPS පද්ධති සවිකිරීම, එමෙන්ම ප්‍රවාහනය පිළිබඳ සියලු දත්ත එක්තැන් කර පුළුල් විෂය පථයක් ආවරණය වන පරිදි ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව එළි දැක්වීම හා කොළඹ බැස්ටියන් මාවත ප්‍රධාන බස්නැවතුම්පල හා වච්නියාව ප්‍රධාන බස් නැවතුම්පල බස් ධාවන හා මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීම යන ව්‍යාපෘති හා වැඩසටහන් ප්‍රධාන වේ.

2022 වර්ෂයේද, සමස්ථ ලෝකවාසීන්ට මෙන්ම ශ්‍රී ලංකාවටද මුහුණ පෑමට සිදුවූ කොරෝනා වසංගතය හා ආර්ථික අර්බුදය හමුවේ මෙම සියලුම ව්‍යාපෘති හැකි උපරිමයෙන් ක්‍රියාත්මක කොට පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කරමින් කාර්යක්ෂම පොදු බස් ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා කටයුතු කරන ලදී.

රාජ්‍ය ප්‍රත්පත්තිය නිසි ලෙස අනුගමනය කරමින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා නවීන තාක්ෂණය වැඩිවැඩියෙන් උපයෝගී කර ගැනීමටත් ඒතුලින් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමටත් අනුග්‍රහය ලබා දුන් ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාටත්, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමන්ලා ඇතුළු අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ටත්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සමස්ථ කාර්යමණ්ඩලයටත් නන් අයුරින් සහයෝගය දක්වන ලද පෞද්ගලික බස්රථ හිමිකරුවන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල, ශ්‍රී ලංගම හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවල සභාපතිවරුන් ඇතුළු එම ආයතන වල සියළු කාර්ය මණ්ඩල ඇතුළු අනෙකුත් සියළු පාර්ශවයන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කර සිටිමි.

ශශී වෙල්ගම
සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

1.07 කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය

2022 ජනවාරි සිට 2022 අප්‍රේල් දක්වා

1.	ශශී වෙල්ගම මහතා සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සභාපති
2.	ටී.එම්.ජේ. බණ්ඩාර මහතා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	-සාමාජික (නිලබලයෙන්)
3.	එස්. ජලදීපන් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, මුදල් අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
4.	ජේ.ඒ.එම්.ආර්. ජයසිංහ මහතා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
5.	එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා කළමණාකාර අධ්‍යක්ෂ, සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම	-සාමාජික
6.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික
7.	කේ. බුද්ධදාස මහතා හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සාමාජික
8.	බී.ඒ.ඩී.ඒ. සම්පත් රණසිංහ මහතා සභාපති, පොදුජන පුද්ගලික බස් සංගමය	-සාමාජික

2022 ජූලි සිට 2022 අගෝස්තු දක්වා

1.	ශශී වෙල්ගම මහතා සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සභාපති
2.	ටී.එම්.ජේ. බණ්ඩාර මහතා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	-සාමාජික (නිලබලයෙන්)
3.	එස්. ජලදීපන් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, මුදල් අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
4.	නයෝමි ජයවර්ධන මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
5.	එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා කළමණාකාර අධ්‍යක්ෂ, සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම	-සාමාජික
6.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික
7.	කේ. බුද්ධදාස මහතා හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සාමාජික
8.	බී.ඒ.ඩී.ඒ. සම්පත් රණසිංහ මහතා සභාපති, පොදුජන පුද්ගලික බස් සංගමය	-සාමාජික

2022 නොවැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා

1.	ශශී වෙල්ගම මහතා සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව	-සභාපති
2.	ටී.එම්.ජේ. බණ්ඩාර මහතා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව	-සාමාජික (නිලබලයෙන්)
3.	එස්. ජලදීපන් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, මුදල් අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
4.	නයෝමි ජයවර්ධන මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය	-සාමාජික (නිලබලයෙන්)
5.	එම්.වී.එම්.ඩී.බී. ධනුෂ්ක මුදලිගේ මහතා කළමණාකාර අධ්‍යක්ෂ, සඳමාලි ටුවර්ස් පුද්ගලික සමාගම	-සාමාජික
6.	එස්.ආර්. ගොඩමුණේ මහතා අධ්‍යක්ෂ, නිශානීස් පුද්ගලික සමාගම	-සාමාජික
7.	රංජිත් ජී රූබසිංහ මහතා සභාපති, ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය	-සාමාජික
8.	අමිල රන්මණ්ඩල මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය	-සාමාජික

1.08 ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

1.	ශශී වෙල්ගම මහතා	- සභාපති
2.	ආචාර්ය නිලාන් මිරැන්ඩා මහතා	- අධ්‍යක්ෂ ජනරාල්
3.	කේ.ඒ.සී. කරුණාරත්න මහත්මිය	- අධ්‍යක්ෂ (සැලසුම්)
4.	බී.එම්.ඉන්තිකාර් මහතා	- අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ)
5.	එස්.ඩී. අතුකෝරල මහත්මිය	- අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා)
6.	ඩී.එම්.කේ. දිසානායක මහතා	- අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන)
7.	පී.ජී.සී. කරුණාරත්න මහතා	- සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
8.	පී.ආර්.ඒ.ටී.එන්. රණතුංග මහතා	- සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
9.	එච්.බී.සී. කුමාර මහතා	- සහකාර අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ)
10.	ආර්.ඒ. ඉන්දික ලාල් මහතා	- සහකාර අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ)
11.	මුදිත නවරත්න මහතා	- සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා)
12.	එල්.එස්. විජේන්ද්‍ර මහත්මිය	- සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා)
13.	පී.ඒ.එන්. ප්‍රනාන්දු මහත්මිය	- සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
14.	ඩී.එන්. වීරතුංග මහත්මිය	- සහකාර අධ්‍යක්ෂ (මුදල්)
15.	ඒ.ඒ.එච්.එන්. මුණසිංහ මහත්මිය (2022.10.27 දින දක්වා)	- සහකාර අධ්‍යක්ෂ (නීති)
16.	එස්.එන්. පෙරේරා මහත්මිය	- සහකාර අධ්‍යක්ෂ (ප්‍රවාහන ඉංජිනේරු)
17.	ටී.ඩී.එච්.ටී. තේනුවර මහත්මිය	- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
18.	ඒ.එල්.නෙල්කා මහත්මිය	- සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක)

1.09 කොමිෂන් සභාවේ සංයුතිය

2022 වර්ෂය අවසාන වනවිට කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 224 ක් වූ අතර සේවයේ යෙදී සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 176 ක් විය.

2022.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව

අනු අංකය	තනතුරු නාමය	සේවක කාණ්ඩය	අනුමත කාර්ය මණ්ඩලය	**2022.12.31** දිනට සේවයේ යෙදී සිටි කාර්යමණ්ඩලය	**2022.12.31** දිනට පැවති සේවක පුරප්පාඩු	**2022.12.31** දිනට කොන්ත්‍රාත් පදනම් මත සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලය
01	අධ්‍යක්ෂ ජනරාල්	HM 2 -1	01	01	-	-
02	අධ්‍යක්ෂ	HM 1-1	04	04	-	-
03	සහකාර අධ්‍යක්ෂ	MM 1-1	17	11	6	-
04	කණිෂ්ඨ කළමනාකාර	JM 1-1	21	19	2	-
05	ප්‍රවාහන පද්ධති විශ්ලේෂක	MA 4	36	34	2	-
06	කළමනාකරණ සහකාර	MA 2-1	03	0	3	-
07	කළමනාකරණ සහකාර	MA 1-1	81	65	16	6
08	රියැදුරු	PL 3	13	13	0	-
09	කාර්යාල කාර්ය සහායක	PL 1	48	29	19	2
	එකතුව		**224**	**176**	**48**	**8**

මූලාශ්‍රය - පාලන දෙපාර්තමේන්තුව, ජාගකොස


NTC Organization Structure
Chairman
Director General
HM- 2.1
HM- 1.1
Director Planning
Director Q.A.
Director Operation
Director F & P
MM- 1.1
Engineers
AD Planning
AD QA
AD IT
AD Operation
Accoun-tant
AD/ Procure.
AD Admin.
AD/ Legal
Internal Auditor
JM- 1.1
Junior Manager
Network Administrator
Junior Manager
Finance Assistant
Procurement Officer
Admin Officer
Legal Officer
MA-4
Infrastructure Development Unit
Planning Dept. Units
1 2 3 4
QA Dept. Units
1 2 3 4
IT Division
Operations Dept. Units
1 2 3 4
Account Division
Procurement Division
Administration Division
Internal Audit Division
MA 1.1
Mgt. Asst.
PL3& PL1
Office Asst.
Office Asst. & Drivers

Some Statistics of Private Bus Industry

Private Bus fleet regulated by NTC and PTAs 2022



No of Operated Bus Regulated by NTC & PTAs



Interprovincial Private Buses with GPS Vs Bus Fleet



Inter-provincial Private Bus Services















2022 වර්ෂයේ කාර්යසාධනය

බස් රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, රජයට උපදෙස් දීම සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව පිහිටුවා ඇත.

1991 අංක 37 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනත පිළිවෙලින් 1996 අංක 30 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මගින්ද 2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල පනත මගින්ද 2017 අංක 6 දරණ ජාතික ගමනා ගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මගින්ද සංශෝධනය වී ඇත.

එමගින් පැවරී ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍යයන්ට අනුකූලව සහ පනත අනුව සිදු කළ යුතු විශේෂ කාර්යයන් සම්බන්ධයෙන් ලබාගෙන ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතීන්ට අනුකූලව ශ්‍රී ලාංකික ජනතාවට කාර්යක්ෂම, ඉහළ ප්‍රමිතියකින් යුත් පරිසර හිතකාමී, සුවපහසු ප්‍රවාහන සේවාවක් ලබාදීමට සහ ප්‍රවාහනයට නූතන ප්‍රවේශයක් ඇති කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කර ඇත.

අනු අංකය	පුනරාවර්තන ව්‍යාපෘති
01.	**සමාජයීය ශුභසාධනය ප්‍රමුඛකොටගත් බස් සේවා සැපයීම**
	i. සිසු සැරිය ව්‍යාපෘතිය
	ii. ගැමි සැරිය ව්‍යාපෘතිය
	iii. නිසි සැරිය ව්‍යාපෘතිය
02.	**පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ**
	i. බස් පර්යන්ත මෙහෙයුම් හා ප්‍රතිසංස්කරණ
	ii. ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ
03.	**ගුණාත්මය හා ගාස්තු නියාමනය**
	i. බස් සේවක කණ්ඩායම් පුහුණු කිරීම
	ii. කාලසටහන් හා සේවා අධීක්ෂණය
	iii. බස්ගාස්තු නිර්ණය කිරීම හා සංශෝධනය
	iv. තොරතුරු තාක්ෂණ පද්ධතිය
	v. දූරගමන් සේවා සංඥා පුවරු
	vi. GPS උපකරණ පද්ධති හා මෙහෙයුම් මැදිරිය නඩත්තු කිරීම
	vii. ජාතික ප්‍රවාහන පනත සකස් කිරීම
04.	**ජාගකොස සේවක මණ්ඩලය හා ප්‍රවාහන ක්ෂේත්‍රයට සෘජුව සම්බන්ධිත ආයතනවල නිලධාරීන් පුහුණු කිරීම**
05.	**ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛණ වාර්තාව සකස් කර ප්‍රසිද්ධ කිරීම.**
06.	**ප්‍රවාහනය හා සම්බන්ධිත පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්**

අනු අංකය	ප්‍රාග්ධන ව්‍යාපෘති
01.	පෙරගෙවුම් කාඩ්පත භඳුන්වා දීම (Electronic Fare Collection /ඊ - ටිකට්)
02.	බස් පර්යන්ත හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
03.	ආයතනික ප්‍රතිසංස්කරණ හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

එම ව්‍යාපෘති වල 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ප්‍රගතිය පහත දක්වා ඇත.

2.01 සාමාජයීය සුභසාධනය ප්‍රමුඛ කොටගත් බස්රථ සේවා සැපයීමේ ව්‍යාපෘතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ පැවරී ඇති පාසල් ළමයින් සඳහා සහ විශ්ව විද්‍යාලවල, කාර්මික ආයතන වල සහ ඒ හා සමාන වෙනත් ආයතන වල ශිෂ්‍යයන් සඳහා අනුග්‍රාහක ගාස්තු මත පාසල් සේවා සැලැස්වීම යන කර්තව්‍ය අනුව "සිසුසැරිය" බස් සේවාව ද ලාභ නොලබන මාර්ගවල බස්රථසේවා සැලසෙන බවට වගබලා ගැනීම සහ අවශ්‍ය විටක, එවැනි සේවා සලසන තැනැත්තන්ට මූල්‍යාධාර සැලසීම සහතික කිරීම යන කර්තව්‍ය අනුව "ගැමි සැරිය" සහ "නිසි සැරිය" යන බස් සේවාවන්ද සමාජයීය සුභසාධනය ප්‍රමුඛ කොටගත් බස්රථ සේවා ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ.

පාසල් බස්රථ සේවා ව්‍යාපෘතිය - "සිසු සැරිය"



සහන ගාස්තු ක්‍රමයක් යටතේ ක්‍රියාත්මක කෙරෙන මෙම "සිසු සැරිය" පාසල් බස්රථ ව්‍යාපෘතිය, පාසල් දරුවන්ටම වෙන්වූ වඩාත් විශ්වාසනීය, ආරක්ෂාකාරී ප්‍රවාහන සේවාවක් පාසල් දරුවන් සඳහා සැපයීම අරමුණු කොට 2005 වර්ෂයේදී ආරම්භ කර ඇත. ශ්‍රී ලංගම සහ පෞද්ගලික බස්රථ මෙම ව්‍යාපෘතිය යටතේ ධාවනය කරන අතර මෙම බස්රථ වලින් ගමන්ගන්නා පාසල් දරුවන්ගෙන් සාමාන්‍ය බස්ගාස්තුවෙන් අඩක් පමණක් අයකිරීම විශේෂත්වයකි. එමගින් ධාවකයාට වන මූල්‍යමය හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා පාසල් දරුවන් රැගෙන ධාවනය වන කි.මී. 01කට සහනාධාරයක් උපරිම කි.මී. 110 දක්වා (උදේ හවස ගමන්වාර දෙක සඳහා) රජය විසින් ගෙවීම් කරනු ලැබේ.

භෞතික ප්‍රගතිය

2022 වර්ෂය සඳහා 2022.04.30 දින වන විට නව සේවා 52ක් ආරම්භ කරන ලද අතර නව සිසු සැරිය සේවා ආරම්භ කිරීම 2022 මැයි මස සිට අත්හිටුවන ලදී. එනම්, 2022 මාර්තු මස සිට වරින් වර ඉන්ධන මිල වැඩිවීම හා බස්රථ වල අමතර කොටස් වල මිළ ගණන් ඉහළ යාම හේතුවෙන් බස්රථවල ධාවන පිරිවැය වැඩිවීම අනුව සිසු සැරිය බස්රථ සඳහා ගෙවනු ලබන සහනාධාර සංශෝධනය කිරීමට සිදුවූ බැවින් 2022 වර්ෂය සඳහා ජාතික අයවැයෙන් සිසු සැරිය ව්‍යාපෘතියට වෙන් කරන ලද ප්‍රතිපාදන පවතින සේවා පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් වූ බැවින් නව සේවා ආරම්භ නොකොට ඒ වන විට ක්‍රියාත්මක වූ බස්සේවා පමණක් පවත්වාගෙන යාමට තීරණය කරන ලදී. නමුත් නැවතත් කිහිපවිටක් ඉන්ධන මිළ වැඩිවීම නිසා බස්රථ වල ධවන පිරිවැය ඉතා සීඝ්‍රයෙන් වැඩි වූ හෙයින් මෙම ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක බස්රථ වල ධාවනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ වෙන් කරනලද රු.මි. 650.00ට අමතරව තවත් රු.මි. 566.00ක් ඉල්ලා සිටිමින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමා මගින් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව අන්තර් අයවැය මගින් රු.මි. 900 ක් මෙම ව්‍යාපෘති සඳහා 2022 වර්ෂය සඳහා වෙන් කරන ලදී.

ඉන්ධන මිල සීඝ්‍රයෙන් ඉහලයාම අනුව පෞද්ගලික පාසල් වැන් රථ හා බස් රථවල අයකරන ගාස්තුද ඉතා විශාල වශයෙන් ඉහළ යාම හේතුකොට ගෙන, දෙමාපියන් විසින් මෙන්ම පාසල් වල විදුහල්පතිවරුන් විසින්ද සිසු සැරිය ව්‍යාපෘතිය යටතේ බස්රථ යොදවන ලෙස ඉල්ලීම් රැසක් දිනපතා ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී.

මෙසේ දිනපතා වැඩිවන ඉල්ලීම් කෙරෙහි අවධානය යොමු කරමින් පාසල් දරුවන් වෙත ප්‍රවාහන පහසුකම් සලසා දීම සඳහා සිසු සැරිය සේවාවට විකල්පයක් වශයෙන්, ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි පළාත් තුළ සාමාන්‍ය මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන පෞද්ගලික බස්රථ, සාමාන්‍ය බස්ගාස්තුව අයකර අදාළ ප්‍රවාහන අධිකාරි මගින් පනවා ඇති කොන්දේසි වලට අමතරව විශේෂ කොන්දේසි මාලාවක් යටතේ 'පාසල් සේවා' නමින් උදැසන පාසල් ගමන් වාරය හා සවස් වරුවේ ගමන් වාරය ධාවනය කරවීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ පළාත් ප්‍රවාහන අධිකාරි විසින් ආරම්භ කරන ලදී.

2022.12.31 වන විට එසේ යොදවන ලද 'පාසල් සේවා' බස්රථ ගණන 53කි. ඒ අනුව 2022.12.31 දක්වා ක්‍රියාත්මක 'සිසු සැරිය' හා 'පාසල් සේවා' බස් සේවා ගණන පළාත් අනුව පහත වගුවෙහි දැක්වේ.

අනු අංකය	පළාත	'සිසු සැරිය' බස්සේවා	'පාසල් සේවා'
01	බස්නාහිර	442	53
02	දකුණ	107	-
03	වයඹ	360	-
04	උතුරු මැද	202	-
05	සබරගමුව	124	-
06	ඌව	146	-
07	නැගෙනහිර	126	-
08	මධ්‍යම	56	-
09	උතුර	37	-
10	අන්තර්පළාත්	17	-
	එකතුව	**1617**	**53**

නව සිසු සැරිය සේවා සඳහා 2022.12.31 වන විට ලැබී ඇති ඉල්ලීම් ප්‍රමාණය පළාත් අනුව පහත වගුවෙහි දැක්වේ.

අනු අංකය	පළාත	ඉල්ලීම් ගණන
1	බස්නාහිර	251
2	මධ්‍යම	06
3	දකුණ	23
4	වයඹ	03
5	උතුරුමැද	10
6	සබරගමුව	18
7	ඌව	01
	එකතුව	**312**

ග්‍රාමීය බස්රථ සේවා ව්‍යාපෘතිය -"ගැමිසැරිය"

කිසිදු බස්රථ සේවාවක් ක්‍රියාත්මක නොවන, සමාජයීය වශයෙන් බස්රථ සේවාවක් අවශ්‍ය වුවද ලාභ නොලබන මාර්ග බැවින් මගී ප්‍රවාහනය සඳහා ධාවකයින් ඉදිරිපත් නොවන ග්‍රාමීය ප්‍රදේශ වල වෙසෙන ජනතාවට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2005 වර්ෂයේදී "ගැමිසැරිය" ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.



ගැමිසැරිය බස්රථ සේවාව සඳහා ධාවකයින් තෝරාගැනීම විවෘත ටෙන්ඩර් පරිපාටියක් යටතේ සිදුකරන අතර එහිදී කිලෝමීටර් එකක් සඳහා අඩුම ලංසුවක් ඉදිරිපත් කරන ධාවකයා තෝරාගනී. එසේ තෝරාගන්නා ධාවකයාට අදාළ ප්‍රවාහන අධිකාරිය මගින් ග්‍රාමීය මාර්ගයන්හි මගී ප්‍රවාහනයට මගීසේවා අවසරපත්‍රයක් නිකුත් කරන අතර, එම මගීසේවා අවසර පත්‍රය සහ පළාත් ප්‍රවාහන අධිකාරියේ නිර්දේශය මත ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අදාළ බස්රථ හිමියා ගැමිසැරිය ව්‍යාපෘතියට ඇතුලත් කර ගිවිසුම් අත්සන් කරනු ලැබේ.

මෙම ගිවිසුම අනුව එකඟවන සහනාධාර මුදල උපරිම වසර තුනක් සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබේ. වසර තුනකින් පසු එම මාර්ගය ආර්ථික වශයෙන් ඵලදායී මාර්ගයක් විය හැකි බැවින් සහනාධාර ගෙවීම් අත්හිටුවනු ලැබේ. ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද ගැමිසැරිය සේවා රැසක් මේ වන විට ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ග්‍රාමීය ජනතාවට සේවා සපයමින් ක්‍රියාත්මක වේ.

භෞතික ප්‍රගතිය

2022 වර්ෂය ආරම්භයේදී මෙම ව්‍යාපෘතිය යටතේ බස්රථ සේවා 09ක් සහනාධාර ලබමින් ක්‍රියාත්මක වූ අතර ඉන් බස්රථ සේවා 8කට අදාල සහනාධාර කාලසීමාව 2022 වර්ෂයේ අගෝස්තු මස සිට අවසන් විය.

2022 වර්ෂය සඳහා නව ගැමි සැරිය සේවා 1ක් ආරම්භ කිරීම සඳහා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත යොමු කර ඇති අතර නැගෙනහිර හා ඌව පළාත්වල ගැමි සැරිය සේවා එක බැගින් ආරම්භ කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. තවද පහත දැක්වෙන පරිදි නව ගැමිසැරිය සේවා 5ක් ආරම්භ කිරීම සඳහා ඉල්ලීම් ලැබී ඇත. නමුත් ඉහත විස්තර කළ පරිදි බස්රථ වල ධාවන පිරිවැය ඉතා සීඝ්‍රයෙන් වැඩිවීම නිසා මෙම ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන බස්රථ සේවා වල සහනාධාර මුදලද වැඩිවන නිසා 2022 මැයි මාසයෙන් පසුව මෙම ව්‍යාපතීය යටතේ නව සේවා අරම්භ කිරීම අත්හිටුවන ලදී.

අනු අංකය	පළාත	ඉල්ලීම් ගණන
1	නැගෙනහිර	2
2	ඌව	2
3	දකුණ	1
	එකතුව	**5**

රාත්‍රී බස් සේවා ව්‍යාපෘතිය – "නිසිසැරිය"

රාත්‍රී කාලයේ හා අළුයම කාලයේ පොදු ප්‍රවාහන බස්රථ සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම දිරිමත් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2005 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. මෙමගින් රාත්‍රී කාලයේ හා අළුයම පොදු ප්‍රවාහන බස්රථ අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම නිසා මහජනතාව පත්වන දුෂ්කරතා අවම කර ඔවුන්ට ස්ථීර පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් සැපයීමත්, මහජනයාට වෙනත් ප්‍රවාහන මාධ්‍ය (ත්‍රී විලර්, කුලී රථ) සපයා ගැනීම සඳහා වැය කිරීමට සිදුවන අධික පිරිවැය සහ වැයවන කාලය අවම කිරීමත් මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ.
ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ රාත්‍රී අවසන් ගමන් වාරයට සහ අළුයම පළමු ගමන්වාරයට සහනාධාර වශයෙන් මුදලක් රජය විසින් ගෙවීම් කරන අතර මහජනතාවගෙන් නියමිත බස්ගාස්තුව පමණක් අයකරනු ලැබේ.



භෞතික ප්‍රගතිය

2022 වර්ෂය සඳහා 2022.04.30 දින වන විට නව සේවා 10ක් ආරම්භ කරන ලද අතර ජාතික අයවැයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා ද වෙන් කරන ලද ප්‍රතිපාදන පවතින සේවා පවත්වාගෙන යාම සඳහා වැය කිරීමට සිදු වූ බැවින් නව නිසි සැරිය සේවා ආරම්භ කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි 2022 මැයි මාසයේ අත්හිටුවන ලදී.

ඒ අනුව 2022 .12.31 දිනට ක්‍රියාත්මකව පවතින වලංගු නිසි සැරිය සේවා පළාත් අනුව පහත පරිදි වේ.

අනු අංකය	පළාත	'නිසි සැරිය' බස්සේවා
01	බස්නාහිර	64
02	දකුණ	43
03	වයඹ	21
04	උතුරු මැද	6
05	සබරගමුව	14
06	ඌව	11
07	නැගෙනහිර	1
08	මධ්‍යම	51
09	උතුර	5
	එකතුව	**216**

තවද පහත දැක්වෙන පරිදි නව නිසිසැරිය සේවා 305ක් ආරම්භ කිරීම සඳහා ඉල්ලීම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇත.

අනු අංකය	පළාත	ඉල්ලීම් ගණන
1	බස්නාහිර	67
2	මධ්‍යම	55
3	දකුණ	48
4	වයඹ	41
5	උතුරුමැද	11
6	සබරගමුව	51
7	ඌව	22
8	නැගෙනහිර	4
9	උතුර	6
	එකතුව	**305**

මූල්‍ය ප්‍රගතිය "සිසු සැරිය" "ගැමි සැරිය" සහ "නිසි සැරිය " ව්‍යාපෘති

2022 වර්ෂය ආරම්භයේදී පැවති සිසු සැරිය සේවා 1,565ත් ගැමි සැරිය සේවා 9ත්, නිසිසැරිය සේවා 194ත් සඳහා සහනාධාර ගෙවමින් පවත්වාගෙන යාම සහ 2022 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ නව සේවා සඳහා සහනාධාර ගෙවීම් කිරීමට ජාතික අයවැයෙන් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 650 කි. නමුත් 2022 වර්ෂයේ අතුරු අයවැය මගින් එම මුදල රුපියල් මිලියන 900.0 ලෙස සංශෝධනය කරන ලදී.

නමුත් 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 725.0ක් මහා භාණ්ඩාගාරයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලබාදී ඇති අතර එම රුපියල් මිලියන 725.0, 2022.12.31 දින වන විට සහනාධාර වශයෙන් ගෙවා ඇත. මෙසේ අරමුදල් අඩුවෙන් ලබාදීම නිසා විශේෂයෙන් සිසු සැරිය පාසැල් බස්රථ සේවා සපයන්නන් විශාල සංඛ්‍යාවක් එම ව්‍යාපෘතිය අතහැර යාමට කටයුතු කර ඇති බව 2023 ජනවාරි මස දත්ත අනුව පෙනී යයි.

2.02 බස්නැවතුම් පළ නඩත්තු කිරීම හා බස් පර්යන්ත මෙහෙයුම් ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂයේදී පහත දක්වා ඇති කාර්යයන් සිදු කිරීමට සැලසුම් කරන ලදී.

- ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පරිපාලනය යටතේ පවතින කොළඹ බැස්ටියන් මාවත පෞද්ගලික දුරසේවා බස්රථ අංගනය, වව්නියාව බස්රථ අංගන වල ධාවන කටයුතු මෙහෙයවීම සහ එම ස්ථාන නඩත්තු කටයුතු සිදු කිරීම.
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කළමනාකරණය කරනු ලබන මාකුඹුර, කඩුවෙල, කඩවත බස්නැවතුම්පළ වලින් ක්‍රියාත්මක අධිවේගී මාර්ග හරහා සිදුකරනු ලබන බස්රථ ධාවන කටයුතු මෙහෙයවීම.
- බස්රථ වල ප්‍රමිති පරීක්ෂාව සඳහා ජංගම වැඩසටහන් පැවැත්වීම.
- බස්රථවල පිරිවිතර සම්බන්ධයෙන් ප්‍රවාහන අධිකාරීවල නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- සිංහල අළුත් අවුරුදු බස්රථ සේවාව සහ අනෙකුත් විශේෂිත උත්සව සඳහා මගීන්ට අවශ්‍ය පරිදි බස්රථ සේවා මෙහෙයවීම සිදු කිරීම.

ඒ අනුව 2022 වර්ෂයේ සිංහල අළුත් අවුරුදු බස්රථ සේවාව සාර්ථකව මෙහෙයවීම සිදු කළ අතර සිංහල අළුත් අවුරුදු කාල සීමාව තුළ (2022.04.08 -2022.04.13) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කළමනාකරණය යටතේ පවතින කොළඹ බැස්ටියන් මාවත බස්රථ අංගනයේ සහ අධිවේගී මාර්ග බස් සේවා ක්‍රියාත්මක බස් නැවතුම්පළ වලින් පිටත් කරවන ලද බස්රථ ගමන්වාර සංඛ්‍යාව 5,186කි.

බස් පර්යන්තය	බස්රථ ගමන්වාර සංඛ්‍යාව
බැස්ටියන් මාවත	4,557
මාකුඹුර	309
කඩවත	205
කඩුවෙල	115
එකතුව	**5,186**

බස්රථ වල ප්‍රමිති පරීක්ෂා කිරීමේ වැඩසටහන් 02ක් සිදුකරන ලද අතර එහිදී බස්රථ 65ක ප්‍රමිති පරීක්ෂා කරනලදී. එහිදී හඳුනාගන්නා ලද නියමිත ප්‍රමිතියට නොමැති බස්රථ එම අවස්ථාවේම නියමිත ප්‍රමිතියට සකස් කරවන ලදී.

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 5.7ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 2.62 ක් 2022.12.31 දින වන විට වැය වී ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 45.9 ක් වේ.

2.03 බස්රථ සේවක පිරිස් ලියාපදිංචිය හා පුහුණු කිරීම



ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබාදීමේ අරමුණින් අන්තර් පළාත් පුද්ගලික බස්රථවල සේවය කරන සේවක මණ්ඩල සඳහා විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීමය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ලබාදීම සඳහා අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ අතර මෙම පුහුණු වැඩමුළු නව ප්‍රවේශයකින් පහත අංශ කෙරෙහි වැඩි අවධනයක් යොමු කරමින් ක්‍රියාත්මක කිරීමට 2022 වර්ෂයේ දී කටයුතු කරන ලදි .

ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය, කාන්තා හා ළමා කටයුතු කාර්යාංශය, ජාතික අන්තරායකර ඖෂධ නියාමන අධිකාරිය, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය හා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වැනි ආයතනවල ප්‍රවීන දේශකවරුගේ සහභාගීත්වයෙන් පහත මාතෘකා ඔස්සේ දේශන පැවැත්වීම සිදු කරන ලදී.

- මාර්ග අනතුරු අවම කරගැනීම සහ මාර්ග නීති පිළිපැදීම
- ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මගී සේවා අවසරපත්‍ර වෙනුවෙන් පනවා ඇති කොන්දේසි හා නියමයන්
- පාරිභෝගික සත්කාර සේවා සැපයීමේ ක්‍රමෝපායන්
- අන්තරායදායක ඖෂධ භාවිතයේ ප්‍රතිවිපාක
- බස්රථ තුළ කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම
- රිය අනතුරක් සිදු වූ අවස්ථාවකදී ක්‍රියාකල යුතු ආකාරය හා ප්‍රථමාධාර ලබාදීම

2022 වර්ෂයේ පහත කාණ්ඩ යටතේ පුහුණුවීම් සිදුකරන ලදී.

- නව රියැදුරු කොන්දොස්තරවරුන් සඳහා පුහුණුවීම්
- සේවයේ යෙදී සිටින සේවක මණ්ඩල සඳහා අවුරුදු තුනකට වරක් ලබාදෙන පුහුණුව
- විනය විරෝධී ක්‍රියාවල නිරතවූ රියදුරු/කොන්දොස්තර මහතුන් සඳහා පවත්වන විශේෂිත පුහුණු

එක් පුහුණු සැසියකට උපරිම 120 දෙනෙකුගේ සහභාගීත්වයෙන් එවැනි වැඩමුළු 45 ක් පවත්වා පුද්ගලයින් 5400 ක් සඳහා පුහුණුවීම් ලබාදීමට 2022 වර්ෂයේදී සැලසුම් කරන ලදී.

ඒ අනුව 2022.12.31 දින විට පුහුණු වැඩසටහන් 29 ක් පවත්වා රියදුරු කොන්දොස්තරවරුන් 3268 ක් පුහුණු කරන ලදී.
මෙම ව්‍යාපෘතියේ පුහුණු කරන ලද රියදුරු කොන්දොස්තර වරුන් අනුව භෞතික ප්‍රගතිය සියයට 65 ක් වූ අතර පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව අනුව භෞතික ප්‍රගතිය සියයට 64 ක් වේ.

2022 වර්ෂයේ පුහුණු වැඩසටහන් 45 ක් සැලසුම් කර තිබුනද 2022 වර්ෂයේ මැද භාගය වනවිට රට තුල උද්ගත වූ මුල්‍ය අර්බුදය හමුවේ අවසන් කල හැකි වුයේ වැඩසටහන් 29 ක් පමණි. මෙම තත්වය හමුවේ පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය හැදුනුම්පත් මුද්‍රණය කරන ලබන ප්ලාස්ටික් කාඩ්පත්, මුද්‍රණ තීන්ත, මුද්‍රනයට අවශ්‍ය ලැමිනේටින් ඇතුලු සියලුම ලිපිද්‍රව්‍ය අයිතමයන් වල මිල ගණන් 300% කින් පමණ සහ ආහාරපාන මිල ගණන් සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ යාම හේතුවෙන් රියදුරු කොන්දොස්තර ලියාපදිංචි කිරීමේ හා පුහුණු කිරීමේ ව්‍යාපෘතියට වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවූයෙන් වැඩසටහන් 29 ක් පමණක් පැවැත්වීමට සිදුවිය.

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 4.7ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 4.63 ක් 2022.12.31 දින වන විට වැය වී ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 98.5 ක් වේ.

2.04 ප්‍රවාහන ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ

මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස, පිළිගත හැකි තත්ත්වයකින් යුත් බස්රථ සේවා පවතින්නේද යන වග අවලෝකනය කිරීම සහ එම සේවා පවත්වාගෙන යායුතු අවම මට්ටම තීරණය කිරීම; 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතින් දක්වා ඇති ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කර්තව්‍යයකි.





ඒ අනුව මහජනතාවගේ අවශ්‍යතාවය පරිදි විශ්වසනීය, ගුණාත්මක, සුවපහසු පොදු ප්‍රවාහන බස්රථ සේවා ගෙවිය හැකි මිලකට සැපයීම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සහ එම දත්ත විශ්ලේශනය කර තීරණ ගැනීම සඳහා අදාළ පාර්ශවයන් වෙත යොමු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

පහත ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සමීක්ෂණ සිදු කරනු ලබයි.

- මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා හඳුනාගැනීම සහ ඒ අනුව නව බස්රථ සේවා ආරම්භ කිරීම සඳහා ගෙන් ගෙට ගොස් සිදුකෙරෙන සමීක්ෂණ (House Hold Survey)
- පවතින බස්රථ සේවාවල ධාවන කාලසටහන් සකස්කිරීම හා සංශෝධනය කිරීම සඳහා සිදුකෙරෙන මගී ඉල්ලුම් සමීක්ෂණ (Passenger Demand Survey)
- පවතින බස්රථ සේවාවේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් මහජනතාවගේ තෘප්තිමත්භාවය තහවුරු කරගැනීම සහ ඒ අනුව මහජනතාවට බලාපොරොත්තුවන ගුණාත්මක බස්රථ සේවා සැපයීම සඳහා සිදුකෙරෙන මගීන්ගේ අදහස් විමසීමේ සමීක්ෂණ (Passenger Interview Survey)
- බස්රථවල ධාවන කාල නිර්ණය කිරීම සඳහා සිදුකෙරෙන ධාවන කාල සමීක්ෂණ (Travel Time Survey)

භෞතික ප්‍රගතිය

2022 වර්ෂයේ සමීක්ෂණ 17ක් සැලසුම් කළ නමුත් 2022 වර්ෂයේ ඇතිවූ ඉන්ධන අර්බුදය හේතු කොටගෙන බස්රථ අඛණ්ඩව ධාවනය නොවීම, ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සීමාකිරීම් වැනි හේතූන් නිසා අත්‍යවශ්‍ය සමීක්ෂණ පමණක් සිදු කිරීමට තීරණය කළ බැවින් 2022.12.31 දින වන විට සමීක්ෂණ 14 ක් පමණක් සිදුකරන ලදි.
ඒ යටතේ මහනුවර - කුරුණෑගල මාර්ගයේ මගී ඉල්ලුම පිළිබඳ එක් සමීක්ෂණයක්ද, සිසු සැරිය ව්‍යාපෘතිය යටතේ සමීක්ෂණ 3ක්ද හයිලෙවල් හා ලෝලෙවල් මාර්ගවල ධාවනය කෙරෙන බස්රථවල ධාවන කාලය පිළිබඳ සමීක්ෂණ 5ක්ද සිදු කරන ලදී. මීට අමතරව ගාලු පාරේ "බස් ප්‍රමුඛතා මංතීරු(Bus Priority Lane)" හඳුන්වාදීම පිළිබඳ එක් සමීක්ෂණයක් හා කටුබැද්ද, පිළියන්දල, කඩවත හා මාකුඹුර යන සථානවල "Park & Ride" හඳුන්වාදීම සඳහා එක් සමීක්ෂණයක්ද සිදු කර ඇත.
ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිත්‍ය හා තාවකාලික අවසරපත්‍ර යටතේ අධිවේගී මාර්ග වල ධාවනය වන සියළුම බස්රථ වල මගී පැටවුම හඳුනාගැනීම සඳහා සතියේ දින පහම ආවරණය වන පරිදි සමීක්ෂණයක් සිදු කරන ලද අතර මෙමගින් ධාවනයේ යෙදෙන බස්රථ වල පැටවුම හඳුනාගැනීමත් ඒ අනුව තාක්ෂණික අගය අයකිරීම සඳහා ගැලපීම් කළ යුතු තොරතුරු තීරණය කිරීමත්, කාලසටහන් වල විය යුතු වෙනස්කම් පිළිබඳ හඳුනාගෙන කාලසටහන් යාවත්කාලීන කිරීමත් සිදු කරන ලදී. තවද, කොළඹ - බදුල්ල හා ඊට සමගාමී මාර්ග වල මගී ඉල්ලුම හඳුනා ගැනීම සඳහා කොළඹ, කොට්ටාව, කලුඅග්ගල, ඕපනායක හා බදුල්ල යන ස්ථාන වලදී සමීක්ෂණ සිදු කරන ලදී. මීට අමතරව පානදුර - මාතර අධිවේගී මාර්ග බස්රථවල මගී පැටවුම පිළිබඳ සමීක්ෂණ සිදු කරන ලදී

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 5.0ක් වෙන් කළ අතර 2022.12.31 දින වන විට රුපියල් මිලියන 2.57ක් මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 51.4 ක් වේ.

2.05 දුරගමන් සේවා සීමිත නැවතුම් සංඥා පුවරු සවිකිරීම





අන්තර් පළාත් දුරගමන් සේවා බස්රථ සෑම බස් නැවතුමකම නවත්වමින් කෙටිදුර ගමන්ගන්නා මගීන්ද රැගෙන ධාවනය කිරීම නිසා පළාත්බද ධාවනය වන බස්රථ සේවා සමග ඇතිකරගන්නා අහිතකර තරහය වැලැක්වීමට, දුරගමන් සේවා බස්රථ නැවැත්වීම සඳහා සීමිත නැවතුම් ස්ථාන හඳුන්වා දීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. 2019.06.18 දිනැති අංක 2128/9 දරණ ගැසට් පත්‍රය මඟින් මෙම නව සංඥාව ප්‍රසිද්ධ කර ඇත.

භෞතික ප්‍රගතිය

මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, ශ්‍රී ලංකා පොලිසිය, අදාළ පළාත් ප්‍රවාහන අධිකාරිය යන ආයතනයන්ගෙන් සමන්විත කමිටුව මගින් භෞතිකව පරීක්ෂා කර සීමිත නැවතුම් සංඥාපුවරුව සවිකළ යුතු ස්ථාන නිශ්චිතව හඳුනාගනු ලැබේ.

කොළඹට පිවිසෙන ප්‍රධාන පිවිසුම් මාර්ග 05 ආවරණය වන පරිදි සීමිත නැවතුම් සංඥා පුවරු සවිකිරීමට 2022 වර්ෂයේදී සැලසුම් කරන ලදී. ඒ අනුව 2022.12.31 වන විට, කොළඹ - කතරගම, කොළඹ - ඇඹිලිපිටිය (පහල පාර හා ඉහලපාර ආවරණය වන පරිදි), කොළඹ - අම්පාර, කොළඹ - යාපනය හා කොළඹ - මඩකලපුව දක්වා සීමිත නැවතුම් සංඥාපුවරුව සවිකළ යුතු ස්ථාන පිළිබඳ තොරතුරු ලබාගන්නා ලදී. නමුත් ඒ අතර හටගත් ඉන්ධන අර්බුදය හේතු කොටගෙන කාර්යාලීය කටයුතු සීමා වීම නිසා හංවැල්ල - කිරිඳිවැල මාර්ගයේ සංඥා පුවරු 10ක්ද කොළඹ - කතරගම මාර්ගයේ බෙන්තර පාලම සිට මාගාල්ල දක්වා සංඥා පුවරු 32ක්ද සවිකර අවසන් කර ඇත. තවද කොළඹ සිට අලුත්ගම දක්වා සංඥා පුවරු 42ක් සවිකිරීම, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් සිදු කර අවසන් කර ඇත. බෙන්තර - කතරගම මාර්ගයේ මහමෝදර සිට කතරගම දක්වා සංඥා පුවරු 85ක් ද අතුළුව මෙම වර්ෂය තුළදී සංඥා පුවරු 300ක් සවි කිරීම සඳහා සැලසුම් කර තිබූ නමුත් ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 අනුව මෙම ව්‍යාපෘතියෙහි කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී.

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 5.0ක් වෙන් කළ අතර 2022.12.31 දින වන විට රුපියල් මිලියන 0.82ක් වියදම් කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 16.4 ක් වේ.

2.06 ශ්‍රී ලංගම හා පෞද්ගලික බස්රථ සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස් කිරීම.

2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල පනතින් සංශෝධිත 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව "විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත ඇත්ත වශයෙන් වූ මගී ඉල්ලීම් සපුරාලීම සඳහා රාජ්‍ය බස්සේවයක් හෝ පෞද්ගලික බස් සේවයක් ලබා දීම" අරමුණු කර ගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සහ පෞද්ගලික බස්රථ සඳහා පොදු කාලසටහන් සකස් කරනු ලැබේ.
මෙමගින් බස්රථ අතර හා පවතින අහිතකර තරහය අවමකර එක් එක් පාර්ශවය වෙත නිශ්චිත වූ වෙළඳපොළ කොටස වෙන්කරදීම තුලින් හිතකර තරඟකාරීවයක් ඇතිකර මහජනතාවට විශ්වසනීය, ආරක්ෂිත, සුවපහසු බස්රථ සේවාවක් සැපයීමට අපේක්ෂා කෙරේ.

භෞතික ප්‍රගතිය

බස්නාහිර පළාතෙන් ආරම්භ වන සියළු අන්තර් පළාත් මාර්ග සඳහා ඒකාබද්ධ කාලසටහන් සකස් කර අවසන් කිරීම 2022 වර්ෂයේ ඉලක්කය විය.
ඒ අනුව 2022.12.31 නව කාලසටහන් 24ක් හා කාලසටහන් සංශෝධනය කිරීම් 71 සිදු කරන ලදී.

නමුත් රට තුළ උත්ගතව ඇති ඉන්ධන අර්බුදය හමුවේ ඉන්ධන ප්‍රමාණවත්ව නොලැබීම නිසා බස්රථ ධාවනය අඩාල වීම නිසා කාලසටහන් අනුව බස්රථ පිටත් කරවීමද සිදු නොවූ අතර මගී අවශ්‍යතාවය සැපයීම සඳහා ඉන්ධන ලැබෙන බස්රථ පමණක් ධාවනයේ යෙදවීම සිදු කරන ලදී. එහෙයින් මෙම වර්ෂයේ සැලසුම් කළ ඉලක්කය කරා ගමන් කිරීමට නොහැකි වී ඇත.

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 0.2 ක් වෙන් කළ අතර 2022.12.31 දිනට රුපියල් මිලියන 0.03ක් මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 15 ක් වේ.

2.07 බස් ගාස්තු සංශෝධනය සහ ගාස්තු විෂමතා ඉවත් කිරීම

2002 වර්ෂයේ සිට ක්‍රියාත්මක ජාතික බස් ගාස්තු ප්‍රතිපත්තිය අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් වාර්ෂික බස් ගාස්තු නිර්ණය කිරීම සිදුකරනු ලැබේ. මෙම ගාස්තු ප්‍රතිපත්තිය අනුව බස් ගාස්තු නිර්ණය කිරීමේ පිරිවැය සංරචකය අනුව බස්ගාස්තු සංශෝධනය කළ යුතු බව පෙනී යන්නේ නම් සෑම වසරකම ජූලි මස 01 දින බස්ගාස්තු සංශෝධනය කළ යුතු අතර ඊට අමතරව ඉන්ධන මිල සමස්ත කි.මී. 01 ක පිරිවැය 4% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ඉහල නැංවීමට දායකවූ අවස්ථාවක අන්තර්වාර බස්ගාස්තු සංශෝධන සිදුකරනු ලැබේ.

භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය යටතේ වාර්ෂික බස් ගාස්තු සංශෝධනය හා දැනට පවත්නා බස්ගාස්තු ප්‍රතිපත්තිය වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම 2022 වර්ෂයේ සැලසුම් කර ඇත.
2022 වර්ෂයේ ඉන්ධන මිළ වැඩිවීම හේතුකොට අවස්ථා කිහිපයකදී අන්තර්වාර බස්ගාස්තු සංශෝධන සිදු කරන ලදී. ඒ අනුව, 2022.01.05, 2022.03.15, 2022.04.19 හා 2022.05.25 යන දිනයන්හි පිළිවෙලින් 17.44%, 15%, 35% හා 19.49% වශයෙන් බස් ගාස්තු සංශෝධනය කරන ලදී. 2022.07.01 වාර්ෂික බස්ගාස්තු සංශෝධනය ක්‍රියාත්මක කරන ලද අතර ම බස්ගාස්තු වැඩි වීමේ ප්‍රතිශතය 22% කි. ඉන් අනතුරුව රජය මගින් නැවත ඉන්ධන මිළ සංශෝධනය අවස්ථා දෙකකදී සිදු කිරීම හේතුවෙන්

2022.07.20 හා 2022.08.05 යන දිනයන්හි පිළිවෙලින් -2.23% හා -11.14%කින් අන්තර්වාර බස්ගාස්තු සංශෝධන සිදු කරන ලදී.

ඉන්ධන අර්බුදය හේතුකොටගෙන බස්රථ නියමිත පරිදි ධාවනය නොකිරීම හේතුවෙන් බස් ගාස්තු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සඳහා නියමිතව තිබූ සමීක්ෂණ මෙම වසරේද සිදු කිරීමට නොහැකි වීම මත බස්ගාස්තු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම මෙම වසරේදී සිදුකර ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 2.0ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.64 ක් 2022.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා වියදම් කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 32.0 ක් වේ.

2.08 ප්‍රවාහනය සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම අරමුණු කරගනිමින් පහත දැනුවත් කිරීමේ වැඩසටහන් 8ක් දීප ව්‍යාප්තව පළාත් කේන්ද්‍ර කොට තෝරාගත් ස්ථානයන්හි ක්‍රියාත්මක කිරීමට 2022 වර්ෂයේදී සැලසුම් කරන ලදී.

- මාර්ග ආරක්ෂාව සම්බන්ධව පාසල් සිසුන් දැනුවත් කිරීම
- ප්‍රවාහන සැලසුම්කරණය
- කාලසටහන් සකස්කිරීම.
- කාර්යාලීය ක්‍රම සම්බන්ධව පළාත් ප්‍රවාහන අධිකාරීවල නිලධාරීන් දැනුවත් කිරීම
- බස්රථ ධාවනය, සේවක මණ්ඩල කළමනාකාරීත්වය, මගීසේවා අවසරපත්‍ර කොන්දේසි සම්බන්ධව බස්රථ ධාවකයින් දැනුවත් කිරීම
- මගී අයිතිවාසිකම් සම්බන්ධව මගීන් සහ බස්රථ රියදුරු/ කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීම
- GPS තාක්ෂණය හරහා පාලන මැදිරිය මගින් නිරීක්ෂණය කර නියමිත වේග සීමාවන් උල්ලංඝණය කරමින් අධික වේගයෙන් ධාවනය කළ බස්රථවල රියදුරන් හා හිමිකරුවන් දැනුවත් කිරීම

භෞතික ප්‍රගතිය

මෙම වර්ෂය තුළ පැවති ඉන්ධන අර්බුදය හමුවේ පුද්ගල ඒකරාශී කිරීම් වලට බාධා පැමිණුනු බැවින්, මගී අයිතිවාසිකම් සම්බන්ධව මගීන් සහ බස්රථ රියදුරු කොන්දොස්තර මහතුන් දැනුවත් කිරීම හා අධික වේගයෙන් ධාවනය කළ බස්රථවල රියදුරන් හා හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පමණක් සිදුකළ අතර ඒ අනුව 2022.12.31 දින වන විට වැඩසටහන් 05 ක් පවත්වන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 62.5 කි.




මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ රුපියල් මිලියන 1.5 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 0.63 ක් 2022.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 42 ක් පමණ වේ.

2.09 පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මහජනතාව වෙත සපයන සේවා වඩා කාර්යක්ෂම හා ඵලදායීව සිදු කිරීම සඳහාත් මගී ජනතාවට විශ්වසනීය, ගුණාත්මක, සුවපහසු පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් සැපයීම සඳහාත් දිනෙන් දින පොදු ප්‍රවාහන බස්රථ වලින් ඉවත්වන මගී ජනතාව නැවත පොදු ප්‍රවාහන බස්රථ සේවාව වෙත ආකර්ශනය කරගැනීම සඳහාත් කාර්යාලීය කටයුතු සඳහා සහ පොදු ප්‍රවාහන බස්රථ සඳහා නව තාක්ෂණය හඳුන්වාදීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2022 වර්ෂයේදී විශේෂ අවධානයක් යොමුකර ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී.

- **ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය**





ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණික අංශය විසින් ආයතනයේ දෘඩාංග හා මෘදුකාංග පද්ධති සංවර්ධනය කිරීම, ස්ථාපනය කිරීම මෙන්ම ආයතනයේ කාර්යය පහසු කරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික මැදිහත්වීම් සිදුකිරීම ප්‍රධාන කර්තව්‍යයන් වේ. මෙම තොරතුරු තාක්ෂණික අංශය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ගණනාවක් පවතින අතර, එම ව්‍යාපෘති වල 2022 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

<u>ආයතනික ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතිය</u>





ආයතනික කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම පරිගණක මෘදුකාංගයක් හරහා සිදුකිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. මෙම ව්‍යාපෘතියේදී ආයතනයේ පවතින ධාවන, සැලසුම් හා තත්ත්ව ආරක්ෂණ යන දෙපාර්තමේන්තු වල සිදුකරනු ලබන කාර්යයන් හඳුනාගෙන එම කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම කාණ්ඩ 03ක් යටතේ සිදුකරන ලදී. ඒ තුළින් මහජනතාවට ඉක්මන් සේවාවක් ලබාදීමටත්, ආයතනයේ ලිපිගොනු කටයුතු ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයක් හරහා සිදුකිරීමෙන් වඩා විශ්වාසදායී ආරක්ෂාකාරී මෙන්ම කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

මෙම එක් එක් පද්ධති ක්‍රියාත්මක වීමේදී මෙම පද්ධති හරහා කාර්යයන් සිදුකරන නිලධාරීන් මෙම ව්‍යාපෘතියට අනුගත කරගැනීම හා භාවිතා කරන්නන්ට වඩාත් පහසුකම් සහිතව එම පද්ධතින් හැසිරවීමට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලදී. 2022 වර්ෂයේදී මෙම මෘදුකාංගය වඩාත් සුමටව භාවිතා කිරීමට අවශ්‍ය වූ ඒ ඒ දෙපාර්තමේන්තු විසින් ඉල්ලා ඇති සංශෝධන සිදුකිරීමට වැඩි කාලයක් ගතකරන ලදී. එසේම මගී සේවා අවසරපත්‍රය වෙනුවට NFC කාඩ්පතක් නිකුත් කිරීමට කටයුතු ආරම්භ කර තිබූ අතර එය වැඩි දුරටත් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කරන ලදී. 2022 වර්ෂයේදී මෙම මෘදුකාංගය ක්‍රියාත්මක වීමේදී සිදුවන ගැටළු තත්ත්වයන් අවබෝධ කරගෙන එම ක්‍රියාවලියන් වඩා සුමට කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව ආයතන ස්වයංක්‍රියකරණ ක්‍රියාවලියේ පළමු අදියර නිමකර ඇති අතර ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගන්නා ලද කුඩා වෙනස්කම් තවදුරටත් සිදුකරමින් පවතී .එහි දෙවන අදියර අධාරක ක්‍රියාවලීන් පද්ධතිය සංවර්ධනය කිරීම ආරම්භ කිරීම සම්බන්ධව අධ්‍යයනය කරමින් පවතී.

- **Google තාක්ෂණය ඔස්සේ පොදු ප්‍රවාහන සේවා හඳුන්වාදීම** (GTFS)

Google සිතියම තුළට පොදු ප්‍රවාහන සේවා ඇතුළත් කිරීම 2019 වර්ෂයේදී සිදුකළ අතර, එම ව්‍යාපෘතියේ තවත් දිගුවක් වශයෙන් සියලු පළාත් ප්‍රවාහන අධිකාරීන්ගේ බස්රථ ගමන් මාර්ග මෙම ව්‍යාපෘතියට ඇතුල් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර අතර, ඒ අනුව බස්නාහිර පළාත් ප්‍රවාහන අධිකාරියට ඇතුළත් මාර්ග 259 ක් ද දකුණු පළාත් ප්‍රවාහන අධිකාරියේ මාර්ග 117 සහ ශ්‍රී ලංගම සහ දුම්රිය ධාවන මාර්ග තොරතුරු ද Google සිතියමට ඇතුළත් කරන ලදී.

2022 වර්ෂය අග භාගයේදී තත්‍යකාලීන තොරතුරු ලබා දීමට (GTFS-real-time) අදාල සංවර්ධන කටයුතු United Nations Development Programme ආයතනය අනුග්‍රහයෙන් සිදු කිරීම ආරම්භ කළ අතර එහි කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.



- **මාර්ගගත ක්‍රමයෙන් බස්රථවල ආසන වෙන් කිරීමේ ව්‍යාපෘතිය**

මෙම පද්ධතිය මගින් ආසන වෙන් කිරීමේදී ගෙවීම් සිදු කරනු ලබන මාධ්‍යයන් වැඩි දියුණු කර පද්ධතිය සංවර්ධනය කිරීමට හා නඩත්තු කටයුතු සිදුකිරීමට ආයතනයක් තෝරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු 2022.12.31 දින විට සිදුකරමින් පවතී .

පොදු ප්‍රවාහන බස්රථ ක්ෂේත්‍රය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ රුපියල් මිලියන 7.3ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන 2.82 ක් 2022.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 38.6 ක් වේ.

2.10 බස්රථ සඳහා GPS සවිකිරීම



2022 වර්ෂයේ GPS සිම්පත් 232 ක් නිකුත් කර ඇති අතර බස්රථ 73 ක් සඳහා GPS උපකරණ සවිකර ඇත. ඒ අනුව සමුච්චිත අගයක් වශයෙන් 2022.12.31 වනවිට GPS ඒකකය හරහා බස්රථ 1,365 නියාමනය වන අතර, ඒ අනුව මුළු අන්තර් පළාත් බස්රථ වලින් 44% ක් සඳහා GPS උපකරණ සවිකර අවසන් කර ඇත. MyBusSL ජංගම යෙදුම හරහා GPS සවිකර ඇති බස්රථ සියල්ල සම්බන්ධ සජීවී තොරතුරු බස් මගීන්ට බලාගැනීමට හැකියාව පවතී.

සේවා වර්ගය	බස්රථ සංඛ්‍යාව	GPS සවිකර ඇති සංඛ්‍යාව
අධි සුඛෝපභෝගී	169	146
සුඛෝපභෝගී	560	510
අර්ධ සුඛෝපභෝගී	438	331
සාමාන්‍ය සේවා	1945	378
එකතුව	3,112	1,365

මූලාශ්‍රය -තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුවජාගකොස ,

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ රුපියල් මිලියන 6 ක් වෙන් කළ අතර රුපියල් මිලියන 8.10 ක් 2022.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 100 ඉක්මවා ඇත.

2.11 පෙරගෙවුම් කාඩ් ක්‍රමය (Electronic Fare Collection)





ඕනෑම බස්රථයක භාවිතා කළ හැකි ඊ-ප්‍රවේශපත්‍ර ක්‍රමයක් (e-Ticketing System) 2021 වර්ෂය තුළ හඳුන්වා දීමට සැලසුම් කරන ලදී. ඒ අනුව කටයුතු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙනු ලබන ශ්‍රී ලංකා ගමනාගමන කාඩ්පත් යෝජනාවලිය යටතේ ප්‍රවාහනයේදී භාවිතා කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන මාර්ගස්ථ පෙරගෙවුම් කාඩ්පතක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය Backend මෘදුකාංගය සකස් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ ආයතනයක් තෝරාගෙන 2022 වර්ෂයේදී අදාල මෘදුකාංගය සංවර්ධනය කරන ලදී. එහි ක්‍රියාවලිය සිදුවන ආකාරය සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් වශයෙන් ගාල්ල - මාකුඹුර අධිවේගී මාර්ගයේ බස්රථවල මෙම ශ්‍රී ලංකා පෙර ගෙවීම් කාඩ්පත ක්‍රියාත්මක කරන ලද අතර, මෙම පද්ධතියේ නිරවද්‍යතාවය පරීක්ෂා කරමින් පවති. තවද මෙම මෘදුකාංගය හරහා ශ්‍රී ලංකා පෙර ගෙවුම් කාඩ්පතට අමතරව දැනට භාවිතාවන අනෙකුත් තාක්ෂණික ක්‍රම (QR කේතය, VISA & Master කාඩ්පත් භාවිතය, Virtual card භාවිතය) ඔස්සේ ඊ-ප්‍රවේශපත්‍ර ලබාදීමේ හැකියාව අධ්‍යනය කරමින් පවති.

මූල්‍ය ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ රුපියල් මිලියන 7 ක් වෙන් කළ අතර එයින් රුපියල් මිලියන .012 ක් 2022.12.31 දින වන විට වැය කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 0.17 ක් වේ.

2.12 ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීම







ශ්‍රී ලංකා මහ බැංකුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, ඇතුළු ප්‍රවාහනය සම්බන්ධිත ආයතනයක් වන CILT ආයතනය ආදී ආයතන රාශියකින් තොරතුරු හා දත්ත ඒකරාශීකර එම දත්ත විශ්ලේෂණයකර ඉතා ආකර්ෂණීය ලෙස සකස් කරනු ලබන 'ජාතික ප්‍රවාහන සංඛ්‍යාන වාර්තාව' අඛණ්ඩව වර්ෂයක් පාසා මුද්‍රිත ග්‍රන්ථයක් වශයෙන් හා ඉන්ටර්නෙට් ඔස්සේ ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන්ම එළිදක්වනු ලැබේ.

ප්‍රවාහනය පිළිබඳ පර්යේෂණ කරන, සැලසුම් සකස් කරන ආයතන හා විද්වතුන්ට මෙන්ම ප්‍රවාහනය පිළිබඳ අධ්‍යයන කටයුතුවල යෙදෙන අයට ගොඩබිම, සාගරය හා ගුවන් යන මාධ්‍ය තුන හරහා සිදුකරන සියළු ප්‍රවාහන කාර්යයන් පිළිබඳ තොරතුරු එකම ස්ථානයකින් ලබාගතහැකි මාධ්‍යයක් ලෙසද මෙම වාර්තාව පරිශීලනය කිරීමට හැකිවේ.

භෞතික ප්‍රගතිය

ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාවේ 2020/2021 වර්ෂ දෙකට අදාළ වාර්තාව එක් වාර්තාවක් ලෙස සකස්කර අන්තර්ජාලය හරහා එළිදැක්වීමටත් 2022 වාර්තාව දත්ත රැස් කිරීමේ සිට අනෙකුත් සියළු කාර්යයන් අවසන් කර අන්තර්ජාලය තුළින් එළිදැක්වීමටත් 2022 වර්ෂයේදී සැලසුම් කරන ලදී. ඒ අනුව 2020/21 වාර්තාව 2022 වර්ෂයේ අගෝස්තු මාසයේදී එළිදක්වන ලද අතර 2022.12.31 දින වන විට 2022 වාර්තාව අන්තර්ජාලය තුළින් එළිදැක්වීම සිදු කරන ලදී. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 100 ක් වේ.

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 3.3 ක් වෙන් කළ නමුත් රට තුළ උද්ගතව ඇති ආර්ථික අර්බුදය හේතුවෙන් වාර්තාව මුද්‍රණය කිරීම අත්හිටුවන ලදී. එබැවින් 2022.12.31 දින වන විට රුපියල් මිලියන 0.085ක් පමණක් එනම් වෙන්කළ මුදලින් සියයට 1.45ක් වැය කරන ලදී.

2.13 නාගරික ප්‍රවාහනය සැලසුම් කිරීම

කොළඹ නගරය ආශ්‍රිතව පවතින අධික වාහන තදබදය අඩුකිරීම සඳහා, සුවපහසු, ආරක්ෂිත, සෞඛ්‍යාරක්ෂිත පොදු ප්‍රවාහන බස්රථ සේවාවක් ක්‍රියාත්මක කිරීම තුලින් කාර්යාලීය වේලාවන් තුළදී (Peak hours) කොළඹ නගරය හා තදාසන්න නගර කරා ගමන් පෞද්ගලික වාහන (මෝටර් බයිසිකල් සහ කාර් රථ) සංඛ්‍යාව අඩුකිරීම මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කරන අතර මේ යටතේ,

- Park and Ride / Car Pooling ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීම
- බස්රථ ප්‍රමුඛතා මංතීරු(BPL) හඳුන්වා දීම
- බස් ප්‍රවාහන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වාර්තාවක් සකස් කිරීම

යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.



භෞතික ප්‍රගතිය

- Park and Ride / Car Pooling ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීම

නාගරික වාහන තදබදය අඩුකිරීම සඳහා Vehicle Sharing (Carpooling) ක්‍රමය හඳුන්වාදීම සඳහා Concept paper සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු ප්‍රසම්පාදන කටයුතු සඳහා යොමු කර ඇත.

- බස්රථ ප්‍රමුඛතා මංතීරු(BPL) හඳුන්වා දීම

ගාලුපාරේ BPL ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව වැල්ලවත්ත සිට කොල්ලුපිටිය දක්වා මාර්ගයේ බාධක ඉවත් කිරීම සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් පුනරාවර්තන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 1ක් වෙන් කළ අතර එයින් 2022.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 0.002ක් වැය වී ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 0.2කි.

2.14 ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය හා නවීකරණය

ප්‍රාග්ධන වයාපෘති යටතේ මෙම ව්‍යාපෘතිය මගින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අයත් ගොඩනැගිලි නවීකරණය, නඩත්තුව හා බස් පර්යන්ත නඩත්තුව සිදු කරනු ලැබේ.

භෞතික ප්‍රගතිය

2022 වර්ෂය සඳහා සඳහා සැලසුම් කර තිබූ ප්‍රධාන ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කුඩා කොටසක් පමණක් සිදු කළ අතර ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 මගින් දන්වා ඇති පරිදි ප්‍රාග්ධන වියදම් හා ව්‍යාපෘති අත්හිටුවා ඇත.

මූල්‍ය ප්‍රගතිය

2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අරමුදලින් ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ රුපියල් මිලියන 3ක් වෙන් කළ අතර 2022.12.31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 0.60ක් වැය වී ඇත. ඒ අනුව 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍යය ප්‍රගතිය සියයට 20කි.



03.

ව්‍යාපෘති නොවන කාර්යයන්

- **මහජන පැමිණිලි**

ගුණාත්මක මගී ප්‍රවාහනය සේවාවක් මගී ජනතාවට ලබාදීම සඳහා පොදු ප්‍රවාහන සේවාවේ හැසිරීම ඉතා සියුම්ව නිරීක්ෂණය කළ හැකි මාධ්‍යක් වශයෙන් මෙම සේවාවෙන් ලැබෙන මහජන ප්‍රතිචාර ඉතා වැදගත්වේ.



ඒ අනුව බස්රථවල ගමන්කරන මගීන් ඔවුන් ලබාගන්නා සේවාව සම්බන්ධව හා එම බස්රථවල සේවක කණ්ඩායම්හි හැසිරීම සම්බන්ධව යම් ගැටළුකාරී තත්ත්වයන් ඇති වුවහොත් ඒ සම්බන්ධව පැමිණිලි කිරීමට මහජන පැමිණිලි ඒකකයක් ආයතනය තුළ ස්ථාපිතකර ඇත. පොදු මගී ප්‍රවාහන සේවා මගින්, ගමන් පහසුව සලසා ගන්නා මගීන් හට එකී බස් රථයේදී මුහුණදීමට සිදුවන ගැටළු සහ බස්රථ සේවක කණ්ඩායම විසින් සිදුකරනු ලබන අසාධාරණ, අයුක්තිසහගත ක්‍රියාවන් පිළිබඳ සිදුවීමකදි පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසා දි ඇත.

ඒ අනුව පැමිණිලි ලැබෙන මාධ්‍යන් ලෙස 1955 ක්ෂණික දුරකථන ඇමතුම් ඒකකය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමට අමතරව ලිඛිතව, ෆැක්ස් මාර්ගයෙන්, විද්‍යුත් තැපෑල මගින්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා මෙන්ම My Bus-SL යෙදුම, WhatsApp හා සමාජ මාධ්‍ය (Facebook Page) මගින් පැමිණිලි ලබා ගැනීම සිදු කරයි. එහිදී පැය 24 දින 07 පුරාම ක්‍රියාත්මක වන 1955 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් මගී ජනතාවට අවශ්‍ය තොරතුරු සැපයීම හා බස්රථ සේවා සඳහා වන පැමිණිලි ස්වයංකරණ පද්ධතියට ගොනු කරන අතර පැමිණිල්ල ස්වයංකරණ පද්ධතියට එක්කළ වහාම පැමිණිලිකරුගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් හරහා පැමිණිල්ලට අදාල විමසීම් අංකය යවනු ලැබේ. එලෙස ලැබෙන පැමිණිලි එම අවස්ථාවේදීම පැමිණිලි විමර්ශන ඒකකය වෙත ස්වයංක්‍රියව යොමුකරනු ලබන අතර ඉදිරි විමර්ශන කටයුතු මහජන පැමිණිලි විමර්ශන ඒකකය වෙතින් සිදු කරනු ලැබේ.

මෙම ලැබෙන පැමිණිලි වලින් අන්තර් පළාත් බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ විභාග කරන අතර, පළාත් මගී ප්‍රවාහන අධිකාරී බස්රථ සම්බන්ධව ලැබෙන පැමිණිලි එම අධිකාරී වෙත යොමුකරනු ලබයි. එසේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා ලැබෙන පැමිණිලි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත යොමුකරයි.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවට අන්තර් පළාත් බස්රථ සම්බන්ධව යොමුකරනු ලබන පැමිණිලි සියල්ල සියුම්ව පරීක්ෂා කරන අතර, තව දුරටත් තොරතුරු ලබා ගත යුතු පැමිණිලි සඳහා පැමිණිලිකරුවන් දුරකතනයෙන් සම්බන්ධ කරගනිමින් තොරතුරු ලබා ගැනීම, විමර්ශන කටයුතු වලට

අනුව කැදවිය යුතු පැමිණිලි සඳහා අදාළ පාර්ශවයන් කැඳවීම, වරදේ ස්වභාවය සහ බරපතලකම අනුව බස් රථ හිමියා / සේවක කණ්ඩායමට අවවාද කළ යුතු පැමිණිලි සඳහා වාචික අවවාද කිරීම, ලිඛිත අවවාද කිරීම, රියදුරු/කොන්දොස්තර දඬුවම් පුහුණු වෙත යොමු කිරීම, පරිපාලන ගාස්තු අයකිරීම්, සේවක මණ්ඩලවල සේවා අත්හිටුවීම්, රියදුරු/කොන්දොස්තර ප්‍රවීණතා කාඩ්පත් අසාධු ලේඛණගත කිරීම් වැනි ක්‍රියාමාර්ග මෙන්ම අවසරපත්‍ර ගමන්වාර අත්හිටුවීම් සහ ඇතැම් අවස්ථාවලදී මගීසේවා අවසර පත්‍ර අවලංගු කිරීම් දක්වාද කටයුතු කරනු ලබයි.

ප්‍රගතිය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ක්ෂණික දුරකථන ඇමතුම් දවසේ (1955) පැය පුරාම 24 ක්‍රියාත්මක කිරීම සිදුවේ. 2022 වර්ෂයට අදාල පැමිණිලි ලැබීමේ සංඛ්‍යාත්මක තොරතුරු වගුව පහත පරිදි වේ.

2022 වර්ෂයේ ජනවාරි මස 01 සිට 2022 දෙසැම්බර් මස 31 දක්වා විශමාචාර වර්ග අනුව ලද පැමිණිලි

අනු අංකය	විස්තරය	සංකේත අංකය	ලද පැමිණිලි සංඛ්‍යාව	ප්‍රතිශතය %
1	වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම	SE04	762	19
2	මගීන්ට ආචාරශීලී නොවීම	MN12	589	15
3	නියමිත ප්‍රමාණයට වඩා වැඩි මගීන් රැගෙන යාම	MJ12	601	15
4	නියමිත පරිදි ප්‍රවේශ පත්‍ර නිකුත් නොකිරීම	MJ11	590	15
5	නොසැළකිල්ලෙන් රිය පැදවීම/අධික වේගය/ ජංගම දුරකථනය භාවිතා කිරීම/තරහ කාරි ධාවනය/ සුළු අනතුරු	MJ17 -02	339	9
6	රියැදුරු / කොන්දොස්තර ප්‍රවීණතා කාඩ් පත නොමැතිව සේවයේ යෙදීම	MJ07	35	1
7	අතරමග ස්ථානවල අනවශ්‍ය ආකාරයට බස්රථය නවත්වා මගීන් එකතු කිරීම	MN12-01	191	5
8	නියමිත කාලසටහන උල්ලංඝනය කිරීම	MJ01	228	6
9	නියමිත ස්ථානයෙන් ගමන් ආරම්භ නොකිරීම හා ගමනාන්තය දක්වා ධාවනය නොකිරීම	SE03	237	6
10	බස් රථය මගී ප්‍රවාහනයට සුදුසු තත්ත්වයේ නොතබීම	MJ03	76	2
11	වායු සමීකරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම	MJ02	52	1
12	GPS උපාංග ක්‍රියාත්මක නොවීම	MN12-06	95	2
13	අධික ශබ්දයෙන් කැසට්/ රේඩියෝ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම/ නොගැලෙපෙන වීඩියෝ පට ප්‍රදර්ශනය	MN02	50	1
14	බස ගාස්තු ප්‍රදර්ශණය නොකරිමි	MJ08	51	1
15	වෙනත්	other	25	1
	එකතුව		**3921**	**100**

මූලාශ්‍රය - තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව, (ජා.ග.කොා.ස)



ඒ අනුව 2022 දෙසැම්බර් දින 31 දක්වා අන්තර් පළාත් පෞද්ගලික බස්රථවලදී මගී ජනතාව මුහුණදුන් විවිධ ගැටලු පාදක කරගෙන පැමිණිලි 3487 ක් ඉදිරිපත්වී ඇති අතර, ඉන් වැඩිපුරම පැමිණිලි ලැබී ඇත්තේ වැඩිපුර ගාස්තු අය කිරීම/ ඉතිරි මුදල් ලබා නොදීම සම්බන්ධවයි. එය සංඛ්‍යාත්මක වශයෙන් පැමිණිලි 762 කි.

තවද අන්තර් පළාත් පෞද්ගලික බස්රථ වලින් සිදුකරනු ලබන මාරක අනතුරු සම්බන්ධව ජාතික ගමනාගමන කොමිෂන් සභාව දැඩි ක්‍රියාමාර්ග ගනු ලැබේ. මාරක අනතුරක් වාර්තා වූ වහාම බස්රථයේ ධාවනය අත්හිටුවා පරීක්ෂණ කටයුතු ආරම්භ කරන අතර අධිකරණ වාර්තා හා පොලිස් වාර්තා අනුව මෙම අවසරපත්‍ර අවලංගුකිරීම් හා මාරක අනතුර සිදුකළ රියදුරන්ට නැවත පොදු ප්‍රවාහන සේවා බස්රථවල සේවය කිරීමට නොහැකි වන ආකාරයට සේවා ලියාපදිංචිය අවලංගු කර අසාදු ලේඛණගත කිරීම සිදුකරනු ලැබේ.

- **ජංගම පරීක්ෂණ මගින් අනාවරණය කරගන්නා කරුණු විමර්ශණය කිරීමේ ඒකකය**

ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව අන්තර් පළාත් මගී ප්‍රවාහන පෞද්ගලික බස්රථ සඳහා මගී සේවා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ. එම මගී සේවා අවසරපත්‍ර යටතේ ධාවනය කරනු ලබන බස්රථ සඳහා අනුගමනය කලයුතු කොන්දේසි මාලාවක් පනවා ඇති අතර එම කොන්දේසිවලට අනුකූලව බස්රථ ධාවනය කරන්නේද යන්න පරීක්ෂා කිරීම, ජංගම පරීක්ෂණ ඒකකය , බැස්ටියන් මාවත බස් පර්යන්තය සහ වවුනියාව බස් පර්යන්තය විසින් සිදුකරනු ලබයි. එම

පරීක්ෂණ වලදී අවසරපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් අන්තර් පළාත් බස්රථ ධාවනය කරන බවට අනාවරණය වුවහොත් අදාල බස්රථ පිළිබඳව විමර්ශනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ මෙම සේවාවේ ප්‍රධාන අරමුණ වන්නේ ගුණාත්මක සේවාවක් මගී ජනතාවට ලබාදී පොදු ප්‍රවාහනය සඳහා වැඩි මගී ප්‍රමාණයක් ආකර්ශනය කරගැනීම වේ.

<u>ප්‍රගතිය</u>

ජංගම පරීක්ෂණ අංශය, බැස්ටියන් මාවත බස් පර්යන්තය සහ වවුනියාව බස් පර්යන්තය මගින් මාර්ගස්ථව පරීක්ෂා කරනු ලබන බස්රථ වලින් හඳුනාගන්නා මගී සේවා අවසරපත්‍ර කොන්දේසි කඩකිරීම් සඳහා පරිපාලන ගාස්තු අයකිරීම, කොන්දේසි කඩ කරන රියදුරු කොන්දොස්තර මහතුන් සේවාස්ථ පුහුණුව සඳහා යොමුකිරීම, මගී සේවා අවසර පත්‍ර අත්හිටුවීම මෙන්ම අවලංගු කිරීම් සිදුකිරීමද මේ ඒකකය යටතේ සිදුකරනු ලබයි. 2022 වර්ෂයේ විමර්ශනය කරන ලද කොන්දේසි කඩකිරීම් ගණන 4237 කි.

අනු අංකය	*විස්තරය*	*සංකේත අංකය*	*ලද පැමිණිලි සංඛ්‍යාව*	ප්‍රතිශතය %
1	නියමිතස්ථානයෙන් ගමන් ආරම්භ නොකිරීම හා ගමනාන්තය දක්වා ධාවනය නොකිරීම	SE03	503	12
2	මගීන්ගෙන් වැඩිපුර ගාස්තු අය කිරීම	SE04	202	5
3	නියමිත කාලසටහන උල්ලංඝනයකිරීම	MJ01	20	0.5
4	අණ නොතකා බස්රථය ධාවනය කිරීම	MJ04	71	2
5	රියැදුරු / කොන්දොස්තරප්‍රවීණතා කාඩ් පත නොමැතිව සේවයේ යෙදීම	MJ07	1423	33
6	බස්ගාස්තු ප්‍රදර්ශණය නොකිරීම	MJ08	256	6
7	නියමිත පරිදි ප්‍රවේශ පත්‍රනිකුත් නොකිරීම	MJ11	366	8.5
8	නියමිත ප්‍රමාණයට වඩා වැඩිමගීන් රැගෙන යාම	MJ12	158	4
9	කල් ඉකුත්වූ රියැදුරු කොන්දොස්තර හැඳුනුම්පත් භාවිතය	MN07	436	10
10	කල් ඉකුත් වී විමර්ෂන වලට සහභාගි වීම	MN11	673	16
11	වෙනත්		129	3
	එකතුව		**4237**	**100**

මූලාශ්‍රය - තත්ත්ව ආරක්ෂණ හා බාහිර සම්බන්ධතා දෙපාර්තමේන්තුව, (ජා.ග.කො.ස)

ඒ අනුව විමර්ශන කටයුතු සිදුකර කොන්දේසි කඩකරන ලද පුද්ගලයින්ට අවවාද කිරීම්, පරිපාලන ගාස්තු අයකිරීම් වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත.

- **අන්තර්පළාත් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම**

2022.12.31 දිනට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වලංගු මගීසේවා අවසරපත්‍ර සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ.

අනු අංකය	සේවා වර්ගය	බස්රථ සංඛ්‍යාව
1	සාමාන්‍ය	1985
2	අර්ධ සුඛෝපභෝගී	431
3	සුඛෝපභෝගී	557
4	අධි සුඛෝපභෝගී	178
එකතුව		**3151**



- **මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ බස්රථ සේවා වැඩි දියුණු කිරීම.**

මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් උපරිම අයුරින් මහජනතාවට ප්‍රයෝජන අවස්ථාව ලබාදීමද අරමුණු කරගනිමින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ දැනට සුඛෝපභෝගී සේවාව යටතේ නිතුක්කර ඇති මගී සේවා අවසරපත්‍ර හිමි අතිරික්ත බස්රථ තාවකාලික අවසරපත්‍ර යටතේ මාර්ග සංශෝධනය කර මාකුඹුර සිට දිවයිනේ ප්‍රධාන නගර 16ක් දක්වා 2022.02.01 දින සිට ධාවනයේ යොදවා ඇත.

- **නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම**

2005,2015,2016,2017 වර්ෂ වලදී මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ලබාදී තිබූ සියළු අමාත්‍ය මණ්ඩල අනුමැතීන් අවලංගු කර අන්තර් පළාත් මාර්ග සඳහා නිත්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙසට අමාත්‍ය මණ්ඩල විසින් විද්වත් කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව එම විද්වත් කමිටුවේ වාර්තා සකස් කර අමාත්‍යාංශය වෙත භාරදී ඇත. කමිටුවක් මගින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට යෝජනා කර හිටපු අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දෙමින් සඳහන් කර ඇත්තේ මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වල මතුකොට දක්වා ඇති කරුණු සැළකිල්ලට ගෙන ඉදිරි කටයුතු කරන ලෙසය. මුදල් අමාත්‍යතුමාගේ නිරීක්ෂණයට අනුව විද්වත් කමිටුව මගින් සකස් කර ඇති වාර්තාව මගින් යෝජිත ක්‍රමවේදයේ සංකීර්ණ කරුණු පවතින්නේ නම් එම යෝජනාවෙන් දැක්වෙන නිර්ණායක සහ කරුණු පදනම් කර ගනිමින් සහ ආවරණය වන පරිදි අදාල සියළුම පාර්ශව කරුවන්ගේ එකඟත්වය සහිතව විනිවිදභාවයෙන් යුතුව වගවීම සහතික වන පරිදි එම සංකීර්ණ කරුණු සඳහා සරල ක්‍රමවේදයක් ඇතුලත් වන සේ එම වාර්තාව සංශෝධනය කර අමාත්‍ය මණ්ඩලය වෙත මාස 2 ක් තුල නැවත ඉදිරිපත් කරන ලෙසය.

ඒ අනුව රේඛීය අමාත්‍යාංශය විසින් අදාල වාර්තාව සකස් කරමින් පවතී.

- **2015 වර්ෂයේ සිට තාවකාලික අවසරපත්‍ර මත දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා බස්රථ ධාවනය කරන මගී සේවා අවසරපත්‍ර හිමියන්ට නිත්‍ය මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු වාර්තා කල අතර මගීසේවා අවසර පත්‍ර හිමියන් ගොනුකර ඇති නඩු කටයුතු සමථයකට පත්කර නිත්‍ය මගීසේවා අවසර පත්‍ර ලබාදීමට

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇති අතර නඩු කටයුතු සමථයකට පත්කර ගන්නා ලෙස මගීසේවා අවසර පත්‍ර හිමියන් දැනුවත් කර ඇත. නඩු කටයුතු සමථයට පත්වීමෙන් පසු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අදාල මාර්ගයේ තාක්ෂණික අගය අයකර අධිවේගී මාර්ගය හරහා නිත්‍ය මගීසේවා අවසර පත්‍ර ලබාදීමට කටයුතු කර ඇත.

- **ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.**

සංශෝධනය කරන ලද ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනත් කෙටුම්පත මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණද, ත්‍රී රෝද රථ සඳහා අධිකාරියක් පිහිටුවීමේ 2021 අයවැය යෝජනාව ක්‍රියාත්මක නොවන බැවින් ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත් සංශෝධනයට ත්‍රී රෝද රථ, පාසල් ළමුන් ප්‍රවාහනය කරන බස්රථ සහ වෑන්රථ හා කාර්යාල ප්‍රවාහන සේවා සඳහා රෙගුලාසි සකස් කිරීම, ප්‍රමිති නිශ්චය කිරීම හා මාර්ගෝපදේශ නිකුත් කිරීම සම්බන්ධව ප්‍රතිපාදන නැවත ඇතුළත් කර, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු සිදුකරන ලදී.

- **2022 වර්ෂයේ මාණ්ඩලික රැස්වීම් හා විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය**

2022 වර්ෂය තුළ පවත්වනු ලැබූ කොමිෂන් සභා රැස්වීම් සංඛ්‍යාව	13
2022 වර්ෂය තුළදී පවත්වනු ලැබූ විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව	04

වාර්ෂික ගිණුම්

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2022	2021
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත සහ උපකරණ	4	366,737,349.24	385,284,936.64
නොනිමි වැඩ		30,502,154.10	30,502,154.10
පුස්තකාල පොත්		1,364,973.81	1,269,973.81
මුලු ජංගම නොවන වත්කම්		**398,604,477.15**	**417,057,064.55**
ජංගම වත්කම්			
ලැබීම් , තැන්පතු සහ අත්තිකාරම්	5	11,267,911.70	12,038,356.05
ලැබීම් - සේවක	6	34,170,500.00	27,806,515.00
ආයෝජන - කාලීන තැන්පත්	7	47,167,553.63	44,842,369.40
ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්	8	16,442,375.00	15,645,319.00
ලැබියයුතු පොළී ආදායම්		11,423,878.44	1,601,883.32
මුදල් හා මුදල් සමාන ද	9	645,816,144.11	382,818,404.76
මුලු ජංගම වත්කම්		**766,288,362.88**	**484,752,847.53**
මුලු වත්කම්		**1,164,892,840.03**	**901,809,912.08**
බැරකම්			
ජංගම නොවන බැරකම්			
රජයේ ප්‍රතිපාදන	10	199,801,150.37	221,338,847.15
සාරධෝෂික වෙන්කිරීම්	11	58,167,667.00	55,905,538.50
මුලු ජංගම නොවන බැරකම්		**257,968,817.37**	**277,244,385.65**
ජංගම බැරකම්			
ගෙවිය යුතු වියදම්	12	2,092,191.14	1,572,067.70
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		51,793,404.00	55,608,904.00
වෙන්කිරීම් හා උපචිත වියදම්	13	199,240,223.88	91,769,582.11
මුලු ජංගම බැරකම්		**253,125,819.02**	**148,950,553.81**
සමුච්චිත අරමුදල		**653,798,203.64**	**475,614,972.62**
මුලු ශුද්ධ වත්කම් / හිමිකම්		**1,164,892,840.03**	**901,809,912.08**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන , ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSA S) වලට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම් කර ඇති බවට සහතික කරන ලදී .

.....

අධ්‍යක්ෂ (මුදල් හා ප්‍රසම්පාදන)

මූල්‍ය ප්‍රකාශන වල අංක 05 සිට 08 දක්වා පිටු වල දක්වා ඇති මූල්‍ය ප්‍රතිපත්ති හා අංක 09 සිට 15 දක්වා පිටු වල දක්වා ඇති සටහන් වලට අනුගතව සකස් කර ඇත .

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම් සඳහා වගකියනු ලැබේ .

.....

සභාපති

.....

කොමිෂන් සභාවේ සාමාජික

දිනය: 2023.02.27

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ශ්‍රී ලංකා රුපියල්වලිනි)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් කාර්යඵලය පිළිබඳ ප්‍රකාශය	සටහන්	2022	2021
ආදායම			
ආදායම	**14**	391,793,781.41	87,924,167.99
වෙනත් ආදායම්	**15**	85,921,825.20	45,782,225.01
එකතුව		**477,715,606.61**	**133,706,393.00**
වියදම්			
මෙහෙයුම් වියදම්	**16**		
සේවක පාරිශ්‍රමික	**16.1**	166,986,938.21	147,693,919.90
ප්‍රවාහන වියදම්	**16.2**	19,682,034.37	12,145,986.55
ගමන් වියදම් සහ යැපීම් දීමනා	**16.3**	3,143,060.00	948,000.50
ආයතන වියදම්	**16.4**	41,495,248.71	34,610,830.70
ස්ථාවර වත්කම් ඇලුත්වැඩියා සහ නඩත්තු	**16.5**	3,654,588.82	1,933,901.07
සේවක සුභසාධනය	**16.6**	11,515,135.67	6,890,333.11
කාර්ය මණ්ඩල සංවර්ධනය	**16.7**	397,141.53	216,610.00
නීති හා වෙනත්ගාස්තු	**16.8**	2,504,645.00	1,240,819.00
සන්නිවේදන වියදම්	**16.9**	957,866.90	572,145.55
ක්ෂය වීම්	**16.10**	19,424,465.52	20,385,908.04
මූලාගාස්තු	**16.11**	98,087.30	44,171.20
වෙනත් වියදම්	**16.12**	775,975.50	829,885.14
මුළු මෙහෙයුම් වියදම්		**270,635,187.53**	**227,512,510.76**
වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)		**207,080,419.08**	**-93,806,117.76**
මෙහෙයුම් නොවන ආදායම්	**17**	**4,664,658.92**	**13,749.19**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය (ඌණතාවය)		**211,745,078.00**	**-93,792,368.57**
රජයෙන්ලැබුණු ප්‍රතිපාදන			
ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන ලැබීම්	**18**	**725,000,000.00**	**271,000,000.00**
විශේෂ ව්‍යාපෘති වියදම් (රජයේ ප්‍රතිපාදන)	**19.1**	**725,000,000.00**	**271,000,000.00**
විශේෂ ව්‍යාපෘති වියදම් (ජාගකොස ප්‍රතිපාදන)	**19.2**	**23,561,846.98**	**12,583,877.94**
වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)		**188,183,231.02**	**-106,376,246.51**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම /හිමිකම වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අතිරික්තය (ඌනතාවය)
2021 ජනවාරි 01 දිනට ශේෂය	581,991,219.13
අදාල වසර සඳහා අතිරික්තය / ඌණතාවය	(106,376,246.51)
2021 දෙසැම්බර් 31 දිනටශේෂය	475,614,972.62
	10,000,000.00
අදාල වසර සඳහා අතිරික්තය / ඌණතාවය	188,183,231.02
2022 දෙසැම්බර් 31 දිනටශේෂය	653,798,203.64

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2022	2021
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
වසර සඳහා අතිරික්තය / ඌනතාවය		188,183,231.02	(106,376,246.51)
මුදල් නොවන චලනයන්			
ක්ෂය වීම්		19,424,465.52	20,385,908.04
වත්කම් අපහරණය		(4,664,658.92)	(13,749.19)
ක්‍රමක්ෂය		(21,537,696.78)	(22,167,003.87)
වසර සඳහා පාරිතෝෂික වියදම		5,163,951.00	5,248,909.50
පොළී අදායම		(64,384,128.42)	(23,615,221.14)
මෙහෙයුම් අතිරික්තය /ඌනතාවය - කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර		**122,185,163.42**	**(126,537,403.17)**
කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම්			
ලැබීම්, තැන්පතු සහ අත්තිකාරම්		770,444.35	(4,869,211.45)
ලැබීම් - සේවක		(6,363,985.00)	(1,904,175.00)
ලැබිය යුතු පොළී ආදායම		(9,821,995.12)	992,079.46
ගෙවිය යුතු වියදම්		520,123.44	(298,417.23)
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		(3,815,500.00)	(1,622,500.00)
වෙන්කිරීම් හා උපචිත වියදම්		107,470,641.77	(17,091,876.51)
මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්		**210,944,892.86**	**(151,331,503.90)**
පාරිතෝෂික අරමුදල් ගෙවීම්		(2,901,822.50)	(2,470,872.50)
වත්කම් අපහරණයෙන් ලද මුදල්		4,699,752.00	44,050.00
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල්		**212,742,822.36**	**(153,758,326.40)**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
දේපල පිරියක හා උපකරණ අත්පත් කර ගැනීම		(911,971.20)	(802,289.20)
කෙරිගෙන යන වැඩ		(95,000.00)	-
කාලීන තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් සඳහා ශුද්ධ ආයෝජන		(3,122,240.23)	(3,498,915.99)
පොළී ලැබීම්		64,384,128.42	23,615,221.14
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**60,254,916.99**	**19,314,015.95**
මූල්‍ය ක්‍රියාකාරිත්වය තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		**(10,000,000.00)**	
වර්ෂය තුළ මූල්‍ය ක්‍රියාකාරිත්වය තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(10,000,000.00)**	-
වර්ෂය තුළ මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වෙනස් වීම		**262,997,739.35**	**(134,444,310.45)**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		382,818,404.76	517,262,715.21
වර්ෂ අවසාන මුදල් සහ මුදල් සමාන දෑ	සටහන 09	**645,816,144.11**	**382,818,404.76**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 ඒකාබද්ධ තොරතුරු

1.1 වාර්තාකරන ආයතනය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 1991 අංක 37 දරණ ජාගකොස පනත යටතේ ස්ථාපනය කොට ඇත. කොමිෂන් සභාවේ කාර්යාලය සහ ගණුදෙනු සිදුකරනු ලබන ප්‍රධාන මධ්‍යස්ථානය කොළඹ 05 , උද්‍යාන පාරේ අංක 241 දරන ස්ථානයෙහි පිහිටුවා ඇත.

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍යමය දක්ත ඇතුලත් වේ

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය

කොමිෂන් සභාවේ කාර්යය වනු ඇත්තේ ඔමිනි බස් මගින් මගී ජනතාවට ප්‍රවාහන සේවාවන් සැලසීම පිළිබදව ශ්‍රී ලංකා රජයට උපදෙස් ලබාදීම සහ ඔමිනි බස් සඳහා නිශ්චය කර ගනු ලබන ප්‍රදේශ සඳහා මගී ප්‍රවාහන සේවා බලපත්‍ර නිකුත් කිරීම වේ.

1.3 2022 වර්ෂය අවසානය වන විට ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ස්ථිර සේවක මණ්ඩලය 176 කි. එමෙන්ම කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 8 දෙනෙකු සේවය කර ඇත..

1.4 වාර්තාකරන දිනය

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ දිනය දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වේ.

1.5 නිකුත් කිරීම සඳහා බලයලත් දිනය

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය / සාමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත්තේ 2023.02.27 දිනය.

2 වැදගත් ගිණුම්කරන පිළිවෙත්හි සාරාංශය

2.1 පිළියෙල කිරීමේ පදනම

කොමිෂන් සභාවේ ගිණුම් පිළියෙල කරනු ලබන්නේ රාජ්‍ය අංශයේ ගිණුම් පිළිබඳ ප්‍රමිතීන් (SLPSASs) සහ පොදුවේ පිළිගනු ලබන ගිණුම්කරණ මූලධර්ම (LKAS 20) වලට අනුකූලවය. මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ගත්මිල මත පදනම්ව වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රජයේ ගිණුම් පිළිවෙත් අනුව ඇස්තමේන්තු මත සකස් කර ඇත.
ඉහත සඳහන් ක්‍රියාවලි අනුව ආයතනයේ තොරතුරු, සටහන්, ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමේදී ගිණුම්කරණ ක්‍රියාවලියෙන් පරිබාහිර, විශේෂිත හා සංකීර්ණ වූ අවස්ථාවන් ගිණුම්කරණයට ලක් කිරීමේදී එම අවස්ථාවට යොදාගනු ලබන උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳව සටහන් අංක 3 මගින් දක්වා ඇත.

2.2 ගිණුම් පිළිවෙත් වල වෙනස්කිරීම්

පහත සඳහන් කර ඇති මූල්‍ය ප්‍රකාශන වල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන කාල සීමාව සඳහා ක්‍රමානුකූලව සඳහන් කර ඇත.

පවත්නා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා සසඳමින් වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම අදාල තැන්හි සංශෝධනය කර ඇත.

2.3 විදේශ විනිමය පරිවර්තනය

2.3.1 මෙහෙයුම් සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇති ගණුදෙනු සහ ශේෂය මනිනු ලබන්නේ ආයතනය මෙහෙය වනු ලබන ප්‍රාථමික ආර්ථික පරිසරය අනුවය. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.3.2 ගණුදෙනු සහ ශේෂය

විදේශ විනිමය ගණුදෙනු ක්‍රියාකාරකම් විනිමය ගණුදෙනු බවට පරිවර්තනය කරනුයේ ගණුදෙනු කරන දිනයේ පවත්නා විනිමය අනුපාතය මතය.

2.4 දේපළ පිරියත උපකරන පිරිවැය

දේපළ පිරියත උපකරන පිරිවැය යනු මිලදී ගැනීමේ පිරිවැය හෝ ඉදිකිරීම සඳහා දරන ලද වියදම් වත්කම අපේක්ෂිත කාර්යය සඳහා ක්‍රියාත්මක තත්වයට දැරූ වියදම වේ .දේපළ පිරියත සහ යන්ත්‍ර උපකරණවල වටිනාකම දක්වන විටදී එය මිලදී ගැනීමට දැරූ මූලික වියදම්වල් මෙතෙක් ක්ෂයවීම් හා හානි අඩුකිරීමෙන් පසු ශුද්ධ වටිනාකම දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීමේ, වැඩිදියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ වියදම් හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ තත්ත්වයට පත් කිරීම දක්වා ගිණුම් වත්කම් තීරණය ලෙස සළකා ඇත. වත්කම් වලට අදාල නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් වියදම් අදාල ආදායම් වියදම් ගිණුමට ලියාහැර ඇත.

ඉඩම් වටිනාකම ක්ෂයකිරීමට ලක් නොවන අතර අනෙකුත් වත්කම් ක්ෂයකිරීමට ලක් කිරීමේදී සරළ රේඛීය ක්ෂය ක්‍රමය යොදාගෙන ඇත. අදාල වත්කම් වල ආයුකාලය පහත පරිදි ගෙන ඇත.

වත්කම් වර්ගය	අවුරුද්ද
මෝටර් වාහන	වර්ෂ 05 තුල
ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 10 තුළ
කාර්යාල උපකරණ	වර්ෂ 05 තුල
විවිධ උපකරණ	වර්ෂ 05 තුල
පරිගණක සහ මුද්‍රන යන්ත්‍ර	වර්ෂ 04 තුල
යන්ත්‍ර	වර්ෂ 05 තුල
ගොඩනැගිලි	වර්ෂ 20 තුල
විද්‍යුත් උපකරණ (LED)	වර්ෂ 03 තුල

වත්කම් වල පොත් අගය එහි ඇස්තමේන්තුගත උපයා ගතහැකි අගයට වඩා වැඩි අගයක් ගන්නේ නම් එම වත්කම් වල පොත් අගය වහාම උපයාගත හැකි අගයට ලියාහරිනු ලැබේ.

2.4.1 භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් මත කරන ආයෝජන

භාණ්ඩාගාර බිල්පත් සහ බිල්පත් සහ කාලීන තැන්පතු පිරිවැය අනුව සඳහන් කර ඇත.

2.6 ලැබීම්

ලැබීම් යනු ලබාගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති මුදල් වේ. එකතුව සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී බලාපොරොත්තු වන අතර ලැබීම් වර්ගීකරණය කරනුයේ ජංගම වත්කම් ලෙසය. ලැබීම් හඳුනාගැනීම සහ මනිනු ලබන්නේ ගණුදෙනු කරන කරන වටිනාකම /අගය මතය.

2.7 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් හඳුන්වා ඇත්තේ අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු , බැංකුවල ඇති ක්ෂණික /ස්ථාවර තැන්පතු සහ පාරිතෝෂික අරමුදල්ය

2.8 ගෙවීම්

ගෙවීම් යනු භාණ්ඩ හා සේවා සපයන්නන් ලබාගත් භාණ්ඩ හා සේවා සඳහා අවශ්‍යයෙන් කළයුතු ගෙවීම් වේ. ගෙවීම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් කාලචක්‍රයේ කළ යුතු ගෙවීමක් නම් එය ජංගම වත්කමක් ලෙස වර්ග කරනු ලැබේ. (වසර 1 ක් හෝ ඊට අඩු) එසේ නොමැති අවස්ථාවල ඒවා ජංගම නොවන වත්කම් ලෙස හඳුන්වනු ලැබේ. ගෙවීම් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ ගණුදෙනු කරන මිලට අනුව වන අතර ඉන් පසුව ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී මෙම මිලට මිණුම් කරනු ලැබේ.

2.9 රජයේ ප්‍රතිපාදන

මූල්‍ය නොවන ප්‍රතිපාදන ඇතුලත්ව රජයෙන් ලැබෙන ප්‍රතිපාදන ඒවායෙහි සාධාරන වටිනාකම අනුව හඳුනාගනු ලැබේ.

දේපළ පිරියත සහ උපකරණ වලට අදාල රජයේ ප්‍රතිපාදන ජංගම නොවන වත්කම් වල රජයේ විලම්භිත ප්‍රතිපාදන යටතට ඇතුලත් කර ඇති අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේදී මෙය හඳුනාගනු ලබන්නේ අදාල වත්කම් වල අපේක්ෂිත ආයු කාලයේ සරළ රේඛීය පදනම මතය.

මූල්‍ය නොවන ප්‍රතිපාදන මූල්‍ය නොවන වත්කමෙහි ධාරණ වටිනාකම අනුව ගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකම අනුව ප්‍රතිපාදන ලබාදීම සහ වත්කම් ගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

2.10 මිලදී ගැනීමේ පිරිවැය

මුදල් කාර්යඨලය පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ මිලදී ගන්නා ලද කාලය තුලය.

2.11 සේවක ප්‍රතිලාභ

කොමිෂන් සභාවට නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායකත්වය පිළිබඳ සැළසුම් ඇත

(a) නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැළැස්මක් යනු කොමිෂන් සභාව මගින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම අස්ථිත්වයක් වෙත ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මකි. මෙය පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් බැවින් තවදුරටත් ඒ සඳහා දායකත්ව මුදලක් ගෙවීම සඳහා කොමිෂන් සභාවට භෞතික හෝ අධ්‍යාත්මික බැදීමක් නොමැත. කල් පිරුණු පසු මෙම දායකත්ව මුදල් සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන් හඳුන්වනු ලැබේ.
ජාතික ගමනාගමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් එක් සේවකයෙකුගෙන් දළ පාරිශ්‍රමික මුදලක් ලෙස 15% ක් බැර කරනු ලබන අතර සේවා නියුක්ති භාරකාර අරමුදලට 3% දළ පාරිශ්‍රමිකයක් අය කරනු ලැබේ.

(b) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

සේවකයාගේ සේවා පළමු වර්ෂයේ සිට සේවය කරනු ලබන සෑම වර්ෂයකම මාස ½ ක වේතනය සේවක පාරිතෝෂික අරමුදලට බැර කිරීමට කටයුතු යොදා ඇත. කෙසේ වෙතත් 1983 පාරිතොෂික අරමුදල ගෙවීමේ පනත් අංක 12 අනුව සේවකයෙකුට පාරිතෝෂික අරමුදලට හිමිකම් ලබාගත හැක්කේ වර්ෂ 05 අඛණ්ඩ සේවාවක් කිරීමෙනි.

(c) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

කෙටි කාලීන සේවක ප්‍රතිලාභ පිළිබඳ වගකීම මනිනු ලබන්නේ සේවකයින් විසින් ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගෙවීමට අපේක්ෂිත වට්ටම් හෝ කරන ලද මුදලමය වටිනාකම මතය

2.12 ප්‍රතිපාදන සහ අවිනිශ්චිත වගකීම්

මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ අතීතයේ සිදුකරන ලද සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් කොමිෂන් සභාවට වර්තමානයේ ඇති නෛතික බැදීම හෝ කොමිෂන් සභාවට අවශ්‍ය ආර්ථික සම්පත් පිටතට ගලායෑම සිදුවිය හැකි අතර විශ්වසනීය ලෙස එම ප්‍රමාණයන් ඇස්තමේන්තු ගත කල හැකිය.

පදනම් කරගෙන දැනට පවත්නා බැදීමද වගකීම පියවීම / නිරවුල් කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම අනුව ප්‍රතිපාදන මනිනු ලැබේ.

සියලුම අස්ථාවර වගකීම් මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහනක් ලෙස එළිදරවු නොකළහොත් සම්පත් පිටතට ගලායාමේ හැකියාව දුරස්ථ වනු ඇත.

2.13 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම ආයතනයට ගලා එන අවස්ථාවේදී ආදායම් වශයෙන් හඳුනාගැනීම. කොමිෂන් සභාව අදායම හඳුනාගනු ලබන්නේ ආදායම් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම මැනිය හැකි අවස්ථාව සහ ඉදිරියේදී කොමිෂන් සභාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි සම්භාවිතාව අනුවය.
කොමිෂන් සභාව විසින් ආදායම හඳුනාගැනීම සඳහා පහත දැක්වෙන නිර්ණායක හඳුනාගත හැක. ඒ ඒ ප්‍රධාන මාර්ග වල ආදායම මැනීම සඳහා ආදේශ කර ඇත.

(a) **බලපත්‍ර ආදායම**

මාර්ග බලපත්‍ර වලින් ලැබෙන අදායම හඳුනාගනු ලබන්නේ කොමිෂන් සභාව වෙත අනාගතයේ ආර්ථික ප්‍රතිලාභ සැලැස්මට ඇති හැකියාව මතය.

(b) දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේදි ඇති ලාභ සහ අලාභ

බැහැර කිරීමේදී ඇති ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ලත් මුදල් / උත්පාදන මුදල් ධාරන පිරිවැයත් සමඟ සන්සන්දනය කිරීමෙනි. මෙය මුදල් කාර්යඨල ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

2.14 වියදම්

මෙහෙයුම් කරන කාලසීමාවෙදී දරන ලද වියදම් යනු වාර්තාකරන කාලයේදී ලාභය ලෙස ලැබෙන ආදායමයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට.....

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.15 ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවන ද්‍රව්‍යමය සිදුවීම් සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය ප්‍රකාශයෙහි අවශ්‍ය තැන්වල සුදුසු පරිදි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

2.16 වගකීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව ඇතිවන සියලුම ද්‍රව්‍යමය වගකීම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් කිරීම මඟින් අනාවරණය කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ පිළිවෙත් (නිමාන) සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය මඟින් විනිශ්චයන් ගණනාවක් යොදාගනු ලබන අතර වත්කම්, වගකීම්, ආදායම සහ වියදම හඳුනාගැනීම සහ මැනීම සඳහා තක්සේරු (නිමාන) සහ උපකල්පන රාශියක් උපයෝගී කරගනු ලබයි.
මැනීමට යන හඳුනාගැනීම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන තක්සේරු /පළාත් සහ උපකල්පන පිළිබඳ තොරතුරු පහත දක්වා ඇති පරිදි වේ:

(a) **ක්ෂය වීගෙන යන වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය**
වත්කමේ අපේක්ෂිත ආර්ථික උපයෝගීතාවය මත ශේෂ පත්‍ර දිනයට ක්ෂය වන වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තක්සේරු කරනු ලබන බව කළමණාකාරීත්වය සමාලෝචනයෙහි දක්වා ඇත. මෙම අස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයන්ට හේතුව ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණික උපාංග වල උපයෝගීතාවය වෙනස් කිරීමට ඉවහල් වන යල්පැන ගිය තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමය.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4 දේපළ පිරියත සහ උපකරණ

සින්නක්කර වත්කම් - පිරිවැය

අංක	වත්කම් පංතිය	පිරිවැය				ක්ෂය ප්‍රතිශතය	ක්ෂය කිරීම්				ශේෂය 2022	ශේෂය 2021
		2022.01.01 දිනට ශේෂය	අපහරණය කිරීම්	වසර තුළදී එකතු කිරීම්	2022.12.31 දිනට ශේෂය		2022.01.01 දිනට ශේෂය	අපහරණය කිරීම්	වසර තුළදී එකතු කිරීම්	2022.12.31 දිනට ශේෂය		
1	ඉඩම්	245,000,000.00		-	245,000,000.00	-	-		-	-	245,000,000.00	245,000,000.00
2	ගොඩනැගිලි	195,683,739.57		-	195,683,739.57	5%	88,467,424.67		8,969,967.98	97,437,392.65	98,246,346.92	107,216,314.90
3	මෝටර් වාහන	75,547,270.00	4,682,400.00	-	70,864,870.00	20%	69,477,906.63	4,682,400.00		64,795,506.63	6,069,363.37	6,069,363.37
4	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	35,146,231.11	196,786.23	116,208.00	35,065,652.88	10%	27,480,483.97	161,693.15	1,909,571.29	29,228,362.11	5,837,290.77	7,665,747.14
5	කාර්යාල උපකරණ	24,729,283.63	474,878.00	85,053.20	24,339,458.83	20%	19,157,809.82	474,878.00	2,819,494.00	21,502,425.82	2,837,033.01	5,571,473.81
6	විවිධ උපකරණ	9,239,644.55	20,700.00		9,218,944.55	20%	6,613,019.48	20,700.00	919,592.02	7,511,911.50	1,707,033.05	2,626,625.07
7	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	66,064,121.12	622,407.69	710,710.00	66,152,423.43	25%	54,928,708.77	622,407.69	4,805,840.23	59,112,141.31	7,040,282.12	11,135,412.35
8	යන්ත්‍රෝපකරණ	1,775,637.00		-	1,775,637.00	20%	1,775,637.00		-	1,775,637.00	-	-
9	විද්‍යුත්ප්‍රදර්ශන නාමිපුවරු	62,415,360.00		-	62,415,360.00	33.33%	62,415,360.00		-	62,415,360.00	-	-
Total		**715,601,286.98**	**5,997,171.92**	**911,971.20**	**710,516,086.26**		**330,316,350.34**	**5,962,078.84**	**19,424,465.53**	**343,778,737.02**	**366,737,349.24**	**385,284,936.64**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2022	2021
5 ලැබියයුතු , තැන්පතු සහ අත්තිකාරම්			
ලැබියයුතු	සටහන 5.1	8,870,638.36	9,018,152.93
තැන්පතු සහ අත්තිකාරම්	සටහන 5.2	2,397,273.34	3,020,203.12
		11,267,911.70	**12,038,356.05**
5.1 ලැබියයුතු			
ලැබිය යුතු ආදායම්		8,654,662.30	8,887,029.25
මූල්‍ය වර්ෂය දෙසාර්තමේන්තුව			
වෙනත් ලැබිය යුතු		215,976.06	131,123.68
		8,870,638.36	**9,018,152.93**
5.2 තැන්පතු සහ අත්තිකාරම්			
තැන්පතු		686,500.00	686,500.00
අත්තිකාරම් - ව්‍යාපෘති		55,000.00	25,000.00
අත්තිකාරම් - ජාගකොස		101,547.50	101,602.52
අත්තිකාරම් ගෙවීම්		1,554,225.84	2,207,100.60
		2,397,273.34	**3,020,203.12**
6 ලැබියයුතු - සේවක			
ආපදා ණය		28,645,050.00	27,338,315.00
රෙදිපිළි සඳහා අත්තිකාරම්		4,711,200.00	330,200.00
උත්සව අත්තිකාරම්		814,250.00	138,000.00
		34,170,500.00	**27,806,515.00**
7 ආයෝජන - කාලීන තැන්පතු			
කාලීනතැන්පතු		47,167,553.63	44,842,369.40
		47,167,553.63	**44,842,369.40**
පාරිතෝෂික වැඩකිම සඳහා වෙනම පවත්වාගෙන යන කාලීන තැන්පතු ආයෝජන මුදල රු		.43,922,369.40 (2020-41,133,092.41)	
8 ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්			
භාණ්ඩාගාර බිල්පත්		16,442,375.00	15,645,319.00
		16,442,375.00	**15,645,319.00**
වෙනම පවත්වාගෙන යන			
9 මුදල් හා මුදල් සමාන දෑ			
මුදල් -අතැති	සටහන 9.1	541,744.50	684,693.48
මුදල් - බැංකු	සටහන 9.2	2,817,699.41	2,894,852.88
කෙටිකාලීන තැන්පතු	සටහන 9.3	642,456,700.20	379,238,858.40
මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් හා මුදල් සමාන දෑ		**645,816,144.11**	**382,818,404.76**
9.1 මුදල්- අතැති			
අතැති මුදල්		466,744.50	609,693.48
සුළු මුදල් අග්‍රිමය		75,000.00	75,000.00
		541,744.50	**684,693.48**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2022	2021
9.2 මුදල් - බැංකු			
මහජන බැංකුව -නාරාහේන්පිට		2,766,229.03	2,797,382.50
මහජන බැංකුව -නාරාහේන්පිට (ආසන වෙන් කිරීම්)		51,470.38	97,470.38
		2,817,699.41	**2,894,852.88**
9.3 කෙටි කාලීන තැන්පතු			
කෙටිකාලීන ආයෝජන සහ කැඳවුම් තැන්පතු		641,978,981.19	68,800,941.09
ආයෝජන - රෙපෝ		-	310,000,000.00
ඉතිරිකිරීමේ ගිණුම - ජාතික ඉතිරිකිරීමේ බැංකුව		477,719.01	437,917.31
		642,456,700.20	**379,238,858.40**
පාරිතෝෂික වගකීම් සඳහා වෙනම පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු මුදල් රු		.380,797.11 (2019-314,759.84) .	
10 රජයේ ප්‍රදාන			
ජනවාරි 01දිනට ශේෂය		221,338,847.15	**243,505,851.02**
වසර තුළ ප්‍රදාන ලැබීම්		-	-
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය		(21,537,696.78)	(22,167,003.87)
දෙසැම්බර් 31ට ශේෂය		**199,801,150.37**	**221,338,847.15**

අංක 241 උද්‍යානය පාර, නාරාහේන්පිට පිහිටි ඉඩම ශ්‍රී ලංකා රජයෙන් ලද මූල්‍ය නොවන රජයේ ප්‍රදානයක් ලෙස හඳුනාගෙන ප්‍රදානය ලද අවස්ථාවේ වෙළඳපොල අගයට වත්කම් සටහන් කරගන්නා ලද අතර ගොඩනැගිලිවල ඵලදායී ජීවිත කාලය සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ.

11 ගෙවිය යුතු විශ්‍රාමික ප්‍රතිලාභ		
ජනවාරි 01 දිනට ශේෂය	55,905,538.50	53,127,501.50
වසර තුළ හඳුනාගත් වියදම්	5,163,951.00	5,248,909.50
වසර තුළ කරන ලද ගෙවීම්	(2,901,822.50)	(2,470,872.50)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**58,167,667.00**	**55,905,538.50**

12 ගෙවිය යුතු		
කුලියට ගැනීම්	47,071.79	47,071.79
කාර්තික සමිති සඳහා දායකත්වය	8,200.00	8,200.00
මුද්දර ගාස්තු	13,725.00	14,100.00
රක්ෂණ		0.00
උපයන විට ගෙවීමේ බදු	58,800.00	418.00
විවිධ ණයහිමියෝ	161,000.00	0.00
වෙනත් ගෙවිය යුතු	581,460.19	561,460.19
EPF ගෙවිය යුතු	67,127.50	67,246.75
ETF ගෙවිය යුතු	8,055.30	8,069.61
බැංකු ණය සහ තැන්පතු		0.00
ආසන වෙන් කිරීම සඳහා ගෙවිය යුතු	103,711.36	103,711.36
ආපසු ගෙවිය යුතු GPS ඒකක ගාස්තු	281,250.00	
BIA ගේවිවේ වාහනය	761,790.00	761,790.00
	2,092,191.14	**1,572,067.70**

13 වෙන් කිරීම් සහ උපචිත වියදම්			
උපචිත වියදම් - ව්‍යාපෘති	**සටහන 13.1**	175,706,820.33	71,445,218.70
උපචිත වියදම් - පුනරාවර්තන	**සටහන 13.2**	22,608,377.55	18,348,337.41
විගණන ගාස්තු වෙන් කිරීම්		925,026.00	1,976,026.00
		199,240,223.88	**91,769,582.11**

(වර්ෂයේ තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2022	2021
13.1 උපචිත වියදම් - ව්‍යාපෘති		
පුනරාවර්තන		
සමාජයීය සුභසාධන බස් සේවා සඳහා දායකත්වය	174391106.7	69,892,536.00
පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ	193028	735,752.70
ඉණාත්මය හා ගාස්තු නියාමනය	760551.55	816,930.00
ප්‍රවාහනය ආශ්‍රිත පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්		-
ජාතික ප්‍රවාහන සංඛ්‍යා ලේඛණ වාර්තාව	37696.25	
	175,382,382.50	**71,445,218.70**
ප්‍රාග්ධන		
පුද්ගලික බස් කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණ	324437.83	-
	324,437.83	-
	175,706,820.33	**71,445,218.70**
13.2 උපචිත වියදම් - පුනරාවර්තන		
ප්‍රසාද දීමනා	187,500.00	30,000.00
පිරිසිදු කිරීමේ සේවා	1,078,963.72	869,283.58
සන්නිවේදන	210,247.94	176,104.98
විදුලිය සහ බලය	713,067.74	661,824.20
සේවක සුභසාධන	6,725,989.01	4,882,777.60
සේවක වෛද්‍යාධාර ක්‍රමය	7,500.00	5,000.00
ඉන්ධන සහ ලිහිසි	538,851.30	196,247.21
නිවාඩු දින දීමනා -විධායක	45,351.00	35,955.50
භාෂා දීමනා		-
නීති ගාස්තු	325,700.00	-
ගමන් වියදම් - දේශීය	144,150.00	70,963.00
මෝටර් රථ අළුත්වැඩියාව		-
කාර්යාල උපකරණ නඩත්තු	244,201.35	117,261.00
වෘත්තීය ආයතන සාමාජික ගාස්තු	7,500.00	4,000.00
රැස්වීම් සඳහා ආහාරපාන	16,277.50	3,040.00
පුවත්පත් සහ සඟරා	27,000.00	14,092.00
කාර්යාලයීය අවශ්‍යතා	25,770.00	15,880.00
විවිධ වියදම්	293,055.30	240,904.40
අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන	1,214,288.00	963,161.00
පුවත්පත් දැන්වීම්		-
මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තුව	1,057,950.00	274,429.79
වැටුප් හා වේතන	346,529.99	257,586.97
ආරක්ෂක සේවා	2,545,948.15	1,419,277.05
කාර්ය මණ්ඩල පුහුණු	44,336.74	48,031.74
ප්‍රවාහන සහ කුලී ගාස්තු	151,800.00	133,920.00
ජලය	83,834.49	45,089.49
ලඳුපත් මත මුද්දර ගාස්තු	12,800.00	4,100.00
ඉනිරී වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්	6,559,765.32	7,879,407.90
	22,608,377.55	**18,348,337.41**

වඩාත් කුඩා දශම ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ.

12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2022	2021
14 ආදායම්		
14.1 බලපත්‍ර ආදායම්		
මාර්ග බලපත්‍ර ආදායම්	127,574.00	1,500.00
බලපත්‍ර අළුත්කිරීම් ආදායම්	26,554,715.00	11,555,148.00
මාර්ග වෙනත් ආදායම්	194,316,814.62	27,180,283.05
	220,999,103.62	**38,736,931.05**
14.2 වෙනත් ආදායම්		
පරිපාලන ආදායම්	60,976,199.00	27,763,304.00
බැස්වියන් මාවත වැසිකිලි ආදායම්	17,594,454.66	6,687,276.75
විවිධ ආදායම්	92,224,024.13	14,736,656.19
	170,794,677.79	**49,187,236.94**
මුළු ආදායම්	**391,793,781.41**	**87,924,167.99**
15 වෙනත් ආදායම්		
15.1 පොළී ආදායම්		
කෑන්පතු මත පොළිය	63,216,258.42	22,536,193.14
ආපදා අරමුදල් පොළිය	1,167,870.00	1,079,028.00
	64,384,128.42	**23,615,221.14**
15.2 වෙනත්		
රජයේ ප්‍රදාන මත ක්‍රමික්ෂය	21,537,696.78	22,167,003.87
	21,537,696.78	**22,167,003.87**
	85,921,825.20	**45,782,225.01**
16 මෙහෙයුම් වියදම්		
16.1 සේවක මණ්ඩල වියදම්		
වැටුප් හා වේතන	101,413,997.00	87,621,949.10
ජීවන වියදම් දීමනාව	16,936,734.06	16,809,095.09
වෘත්තීය දීමනා	749,612.90	711,677.00
භාෂා දීමනාව	331,740.00	318,925.00
සේවක අර්ථසාධක අරමුදල්	16,187,532.43	15,635,389.01
සේවක භාරකාර අරමුදල	3,237,506.49	3,127,077.80
නිවාඩු දින දීමනා -විධායක	753,390.00	277,973.50
අතිකාල දීමනා සහ නිවාඩුදින දීමනා - විධායක නොවන	11,402,755.00	7,202,291.00
සාර්ථ්‍යය නොගත් වෙඩෑ නිවාඩු සඳහා ගෙවීම්	6,492,219.33	8,046,632.90
සාරිකෝෂ්ක	5,163,951.00	5,248,909.50
ප්‍රසාද දීමනා	4,317,500.00	2,694,000.00
	166,986,938.21	**147,693,919.90**
16.2 ප්‍රවාහන		
මෝටර්රථ අළුත්වැඩියා සහ නඩත්තු	5,940,025.59	4,250,922.44
ඉන්ධන සහ ලිහිසි	9,383,548.56	3,564,886.89
ප්‍රවාහන සහ කුලී ගාස්තු	3,081,345.38	3,346,465.78
බලපත්‍ර සහ රක්ෂණ	1,277,114.84	983,711.44
	19,682,034.37	**12,145,986.55**
16.3 ගමන් වියදම් හා යැපීම් දීමනා		
දේශීය ගමන් වියදම්	3,143,060.00	948,000.50
	3,143,060.00	**948,000.50**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වර්ෂයේඹුලාය ප්‍රකාශන සඳහා සටහන්	2022	2021
16.4 ආයතන වියදම්		
කාර්යාලයීය සේවාහා (ලිපිදඩ සහ මුද්‍රණ)	5,838,154.18	3,167,765.92
පිරිසිදු කිරීම්	9,252,568.45	6,013,153.32
විවිපතාම් හා බඳු	374,220.00	374,220.00
ආරක්ෂක සේවා	12,802,424.29	13,039,661.74
විදුලිය සහ බලය	7,134,811.49	6,575,994.55
ජලය	696,535.85	480,886.72
අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු	1,109,000.00	1,112,200.00
රක්ෂිම් සඳහා ආහාරපාන	312,523.15	251,062.10
මාර්ගස්ථ මුලල් රක්ෂණය	35,753.11	31,284.41
සන්නිවේදන	3,939,258.19	3,564,601.94
	41,495,248.71	**34,610,830.70**
16.5 ස්ථාවර වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු		
ගොඩනැගිලි අළුත්වැඩියාව	373,452.64	341,783.00
කාර්යාලයීය උපකරණ අළුත්වැඩියාව	3,240,379.86	1,504,087.38
පරිගණක සහ උපාංග අළුත්වැඩියාව	40,756.32	88,030.69
	3,654,588.82	**1,933,901.07**
16.6 සේවක සුභසාධනය		
සේවක වෛද්‍යාධාර ක්‍රමය	155,000.00	119,687.50
සේවක සුභසාධනය	11,076,960.67	6,770,645.61
හිල දැමීම්	283,175.00	-
	11,515,135.67	**6,890,333.11**
16.7 සේවක සංවර්ධනය		
සේවක පුහුණු කිරීම්	205,500.00	145,000.00
විශ්වවිද්‍යාලය සාමාජික ගාස්තු	191,641.53	71,610.00
	397,141.53	**216,610.00**
16.8 නීති ගාස්තු සහ වෙනත්		
විගණන ගාස්තු	575,000.00	500,000.00
නීති ගාස්තු	1,929,645.00	740,819.00
	2,504,645.00	**1,240,819.00**
16.9 තොරතුරු		
පුවත්පත් දැන්වීම්	852,816.90	539,375.55
පුවත්පත් සහ සඟරා	105,050.00	32,770.00
	957,866.90	**572,145.55**
16.10 ක්ෂය		
ගොඩනැගිලි	8,969,967.98	8,969,967.98
මෝටර් වාහන	.-	348,657.53
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,909,571.29	1,883,190.54
කාර්යාලයීය උපකරණ	2,819,494.00	2,982,370.34
විවිධ උපකරණ	919,592.02	967,080.07
පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර	4,805,840.23	5,234,641.58
	19,424,465.52	**20,385,908.04**
16.11 මූලය ගාස්තු		
බැංකු ගාස්තු	98,087.30	44,171.20
	98,087.30	**44,171.20**

(වර්ෂාන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2022	2021
	16.12 වෙනත් වියදම්		
	විවිධ වියදම්	727,575.50	822,760.14
	ලදුපත් සඳහා මුද්දර ගාස්තු	42,400.00	7,125.00
		6,000.00	
		775,975.50	**829,885.14**
17	**මෙහෙයුම් නොවන ආදායම්**		
	අපහරණය කළ වත්කම්	4,664,658.92	13,749.19
		4,664,658.92	**13,749.19**
18	**ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන**		
	ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදාන - පුනරාවර්තන	725,000,000.00	271,000,000.00
		725,000,000.00	**271,000,000.00**
19	**19.1 රජයේ ප්‍රදාන මත විශේෂ ව්‍යාපෘති වියදම්**		
	ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන		
	සමාජයීය සුභසාධනය සඳහා බස් සේවා සැපයීම්	725,000,000.00	271,000,000.00
		725,000,000.00	**271,000,000.00**
	19.2 ජාගකොස අරමුදල් මත විශේෂ ව්‍යාපෘති වියදම්		
	ව්‍යාපෘති වියදම් -පුනරාවර්තන		
	පුද්ගලික බස් කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ	5,189,845.07	2,756,934.25
	ප්‍රවාහනයේ ගුණාත්මය වැඩි දියුණු කිරීම් හා බස් ගාස්තු නියාමනය	17,039,782.33	8,818,754.37
	සේවක සුහුණුව හා සංවර්ධනය	.-	.-
	ජාතික ප්‍රවාහන සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීම	85,231.75	83,886.00
	ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම	629,040.00	230,839.00
	නාගරික ප්‍රවාහන සැළසුම් කිරීම	2,100.00	.-
		22,945,999.15	11,890,413.62
	ව්‍යාපෘති වියදම් -ප්‍රාග්ධන		
	පුද්ගලික බස් කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ බස් පර්යන්ත සංවර්ධනය	.-	519,249.32
	ප්‍රවාහනයේ ගුණාත්මය වැඩි දියුණු කිරීම	11,920.00	7,520.00
	ආයතනික ප්‍රතිසංස්කරණ සහ යටිතලපහසුකම් සංවර්ධනය	603,927.83	166,695.00
		615,847.83	693,464.32
		23,561,846.98	**12,583,877.94**

(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් වේ)

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 9 (ඒ) වගන්තියට අනුව කොමිෂන් සභාවට වෙත මගී සේවා අවසරපත්‍ර දරන්නන් විසින් බස් රථ සේවා සැලසීමට අදාළ ස්වකීය කටයුතු නිසි පරිදි ඉටු කල නැකිවනු පිණිස ඒ අවසර පත්‍ර දරන්නන්ට ඉංජිනේරු , නාක්ෂණික , නීතිමය , වෛද්‍ය සහ මූල්‍ය ආධාර සහ උපදෙස් ලබාදීමට බලතල පවතී .

මෙම විධිවිධාන මත පදනම්ව , අතිගරු ජනාධිපතිතුමාගේ මඟපෙන්වීම සහ ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ සහ ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ උපදෙස් මත , ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අඩපන වූ ප්‍රවාහන ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මහජන බැංකුව සහ ලංකා බැංකුව වෙතින් මගී සේවා අවසරපත්‍ර හිමිකරුවන් වෙත රුපියල් ලක්ෂ 3 ක ණය මුදලක් ලබා දීම සඳහා පහසුකම් සලසන්නකු ලෙසින් කටයුතු කරන ලදී .

ඉහත සඳහන් කරන ලද බැංකු සමඟ ඇති කරගත්නා ලද ලද අවබෝධතා ගිවිසුම් හි මගී සේවා අවසරපත්‍ර හිමිකරුවන් වෙත ලබා දෙන ලද ණය මුදල නැවත අයකරගැනීමේ ක්‍රමවේදය දක්වා ඇති අතර එම ක්‍රමවේදය අනුව මගී සේවා අවසරපත්‍ර හිමිකරු විසින් ණය වාරික නිසි පරිදි නොගෙවන්නේ නම් , ණය මුදල ලබා ගැනීම සඳහා ඇපකරයක් ලෙස තබා ඇති අදාළ මගී සේවා අවසරපත්‍රය අවලංගු කොට එය තෙවන පාර්ශවයක් වෙත නිකුත් කිරීමෙන් ලබන්නාවූ මුදලින් පැහැර හරින ලද ණය පියවීම සඳහා පහසුකම් සැලසීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ .

කරුණු එසේ වන හෙයින් මගී සේවා අවසරපත්‍ර හිමිකරු විසින් ණය වාරික ගෙවීම පැහැර හැරීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වගකීමක් නොවේ .

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දින වන විට ලංකා බැංකුව වෙත අයවුම් පත් 565 ක් හා මහජන බැංකුව වෙත අයවුම් පත් 24 ක් යොමු කර ඇති නමුත් අනුමත කරන ලද අයවුම් පත් සංඛ්‍යාව පිළිබඳව ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත දැනුම් දී නැත .

2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 3 අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති , දැස්තඹේන්තු හා වැරදීම් සඳහා කරන ලද ගැලපීම් පහත පරිදි වේ .

01) පිළිවෙලින් රු.103,727.60 ක් හා රු .2,275.00 ක් වූ සේවක සුබසාධන චියදම් හා ගමන් චියදම් (දේශීය) 2021 වර්ෂයට අදාල චියදම් ලෙස හඳුනා ගැනීම හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් ඉහල යාම .

02) රු.76,865.25 ක් වූ බැස්චියන් මාවත වැසිකිලි ආදායම් මත අය කරගන්නා ලද දඩ මුදල් 2021 වර්ෂයට අදාල ආදායමක් ලෙස හඳුනා ගැනීම හා මුළු ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් ඉහල යාම හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් පහල යාම .

03) 2021 වර්ෂයට අදාලව දරන ලද ජල ගාස්තු චියදමෙන් රු .1,989.90 ක් වූ නැවත අයකරගත යුතු ජල ගාස්තු ලෙස හඳුනා ගැනීම හා හා මුළු ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් ඉහල යාම හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් පහල යාම .

04) 2021 වර්ෂයට අදාලව රු .3,695.00 ක් වූ උපචිත චියදම් සඳහා අධිවෙන් කිරීම් හඳුනා ගැනීම හා මුළු ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් පහල යාම හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් පහල යාම .

05) පිළිවෙලින් රු .15,698.67 ක් හා රු .41,440.00 ක් වූ වැටුප් හා චේතන චියදම් හා ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් චියදම් 2021 වර්ෂයට අදාල චියදම් ලෙස හඳුනා ගැනීම හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් ඉහල යාම .

2021 මූල්‍ය ප්‍රකාශන වලට අදාලව ඉහත කරන ලද ගැලපීම් මත 2021 වර්ෂයේ ඌනතාවය රු .106,295,655.39 සිට රු .106,376,246.51 දක්වා ඉහළ යන ලදී .

මෙම ගැලපීම් වල ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත අතිරික්තය රු .475,695,563.74 සිට රු .475,614,972.62 පහළ යන ලදී .

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිඔවි/ඩී/එන්ටීසී/එල්ඒ/01/2022/09

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 10 දින



සභාපති,

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා නිබූ රු.51,793,404 ක්වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ශේෂයට අදාලව ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් එම වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ආයතනයේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව මෝටර් රථ වාහන සඳහා වාර්ෂිකව සියයට 20 ක් ක්ෂය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 6,069,363 ක් වූ මෝටර් වාහන වලට අදාලව ක්ෂය වෙන්කිරීම් කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් දැනට භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරිගණක මෘදුකාංග පද්ධතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.30,502,154 ක් වැය කර තිබුණද, අදාල පරිගණක මෘදුකාංග පද්ධතිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව දේපල හා පිරියත ලෙස ගිණුම් ගත කර එහි පිරිවැය වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුලදී ලියා හැරීමට කටයුතු නොකර නොනිමි වැඩ ලෙස ගිනුම් වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික යහ පාලිත මූල්‍ය ප්‍රකාශයන් පිළියෙළ කිරීමට බැඳිටිය පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය	යම් තැනැත්තෙකු වෙත 24 වගන්තිය යටතේ ලබාදෙන ලද මගී සේවා අවසර පත්‍රයක් වෙනත් තැනැත්තෙකුට පැවරිය නොහැකි විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී මගී අවසර පත්‍ර සේවා 33 ක අයිතිය පැවරීම සිදුකර තිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ II වන වගන්තිය	අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය තුල රු. 641,978,981 ක කෙටි කාලීන ආයෝජන සිදුකර තිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645 (අ)	වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් වාහන ලොග් සටහන් පොතක් තබාගෙන නිතිපතා එහි සියලුම සටහන් තැබිය යුතු වුවත් කොමිෂන් සභාවේ වාහන සඳහා ලොග් සටහන් පොත් නඩත්තු කර නොතිබුණි.

(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති පිරිසි 01/ 2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.8 වගන්තිය	රාජ්‍ය ව්‍යාපාර විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ විෂයට දැරීම නොකළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් අමාත්‍යාංශයේ පවත්වන ලද වැඩමුළුවක් සඳහා රු. 198,250 ක් හා අමාත්‍යවරයාගේ නිල නිවසේ ආරක්ෂක සේවා කටයුතු වෙනුවෙන් රු. 225,128 ක්ද වශයෙන් රු. 423,378 ක විෂයට දරා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) කොමිෂන් සභාව විසින් 2021 නොවැම්බර් 26 දින ගාලු පාර කොරිඩෝවේ බස් රථ වල සවි කිරීම සඳහා GPS යන්ත්‍ර 500 ක් ප්‍රවාහන අමාත්‍යාංශයේ සහසර ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණද, 2023 පෙබරවාරි 16 දින වන විට සවි කරවා ලද මුළු GPS ප්‍රමාණය 186 යි. එසේ අපගත ඉත්තේ උපකරණ 314 ප්‍රමාණය බස් රථවලට සවි කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණු අතර තවද ඉතිරි GPS උපකරණවල වගකීම් කාලය ඉක්මයාමට ආසන්න තත්ත්වයේ පැවතිණි.

2.3 වෙනත් කරුණු

(අ) අන්තර් පළාත් බස් රථ සේවා සැපයීම සඳහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නීත්‍යානුකූලවේදයක් සකස් කොට ඒ අනුව ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට කොමිෂන් සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ලාභ නොලබන මාර්ග වල බස් සේවා සැපයීමේ අරමුණින් 2005 වර්ෂයේ සිට ගැමි සැරිය ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර, 2022 වර්ෂය අවසන්වන විට ව්‍යාපෘති 11 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,287,864 ක් වැයකර තිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පවත්නා සේවාවන් පවත්වාගෙන යාමට හා නව සේවා 40 ක් ආරම්භ කිරීමට රු. මිලියන 14.890 ක් වෙන්කර තිබුණද කිසිදු නව සේවාවක් ආරම්භ කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී නිසි සැරිය සේවා පවත්වාගෙන යාමට හා නව ව්‍යාපෘති 100 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 34.5 ක් වෙන්කර තිබුණද, නව එක් සේවාවක් හෝ ආරම්භ කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව තිසි ඇගයීමකින් තොරව මාර්ග ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ 14 ක් සඳහා රු. 5,000,000 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.2,568,180 ක් වැයකර සමීක්ෂණ 17 ක් සිදු කර ඉතිරි ප්‍රතිපාදන වලින් අරමුණුගත කාර්‍යයන්ගෙන් බැහැරව බස් රථ පර්යන්තවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා රු. 2,621,665 ක් වැය කර තිබුණි.

(ඉ) ආයතනයට අයත් වැන් රථයක් රු. 283,135 ක වියදමක් දරා අළුත්වැඩියා කටයුතු සිදුකර අදාල වැන් රථයක් භාවිතයට නොගෙන ආයතන පරිශ්‍රයේ ගාල්කර දිරාපත් වෙමින් පැවතුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න,
වගණකාධිපති.

PLANNING DEPARTMENT
15 MAY 2023
No.
NATIONAL TRANSPORT COMMISSION

ජාතික ගමනාගමන කොමිෂන් සභාව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) පරිගණකගත කරන ලද ටෙන්ඩර් තැන්පතු ලේජරයක් පවත්වාගෙන යනු ලබන අතර ඊට අමතරව ටෙන්ඩර් අංකය අනුව ටෙන්ඩර් ඉදිරිපත් කල අයගේ නම් හා රිසිට්පත් අංක සහිත විස්තරාත්මක ලේඛණ ඇතුලත් ගොණුවක් ගිණුම් අංශය තුල පවත්වාගෙන යනු ලැබේ.

එසේම විමසුමේ සඳහන් පරිදි ඉහත සඳහන් විස්තරාත්මක ලේඛණ එක් රැස් කර එක් ටෙන්ඩර් තැන්පතු ලේඛණයක් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

(ආ) ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු මෝටර් රථ වාහන නැවත සම්පූර්ණයෙන්ම ක්ෂය ගණනය කිරීම් සිදු කර වෙනස හඳුනාගැනීමට හා වැරදි නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලද අතර එම ගණනය කිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(ඇ) මෙම ව්‍යාපෘතිය නිම කරන ලද්දේ 2023.04.19 වන දින වන අතර ඒ අනුව 2023 වර්ෂයට අදාල කාල සීමාව සඳහා ක්ෂය කිරීම් සිදු කිරීම 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී සිදු කරනු ලැබේ.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2.2.2

(අ) ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය අනුව කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද මගී සේවා අවසරපත්‍රයක් වෙනත් තැනැත්තෙකුට පැවරිය නොහැකි අතර එවැනි පැවරීමක් ශුන්‍ය හා බලරහිත වන බව සඳහන් වේ. ඒ අනුව පනතේ මෙම වගන්තිය සංශෝධනය වියයුතු බවට කොමිෂන් සභාව මගින් හඳුනාගෙන ඇති අතර දැනට යෝජිත පනත සංශෝධනයේදී මෙම වගන්තිය සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. දැනට ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද මගී සේවා අවසරපත්‍රයන්හි අයිතිය සංශෝධනය නොකරන අතර , අවසරපත්‍ර හිමිකරුවෙකු මියගිය අවස්ථාවක පමණක් එහි හිමිකාරිත්වය හිමිකම් ලබන පාර්ශවය වෙත පැවරීමට කටයුතුයොදා ඇත. එහිදි අවසරපත්‍රලාභියා මියගිය පසු පමණක් බස් රථය ධාවනය කරලීමට හා ඒ තුලින් වන පුරප්පාඩු හේතුවෙන් මගී ජනතාවට වන අපහසුතාවය මගහැරීම සඳහා කඩිනමින් මගී සේවා අවසරපත්‍රය හිමිකම් ලබන පාර්ශවය වෙත පවරා දීම සිදු කරනු ලබයි. එහිදි නව මගී සේවා අවසරපත්‍රයක් නිකුත් නොකරන අතර මියගිය අවසරපත්‍රලාභියාගේ බලපත්‍රය වෙනුවෙන් ඔහුගේ හෝ ඇයගේ උරුමකරුවෙකුට මගී සේවා අවසරපත්‍රය සංශෝධනය කිරීම පමණක් සිදු කරනු ලබයි.

ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ඒ සඳහා අනුමැතිය ලබා ගෙන අවසරපත්‍රලාභියා මිය ගිය පසු මගී සේවා අවසරපත්‍ර සංශෝධනය කරනු ලැබේ.

(ආ) තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය මගින් ඉල්ලීම් කර ඇත. (අදාල ලිපියේ පිටපත විගණකාධිපතිගේ අංක ආර්ටී/බී/එන්ටීසී/එෆ්ඒ/2012/22 දරන විමසුමට පිළිතුරු සමග විගණනය වෙත ඉදිරිපත් කර ඇත.)

එසේ වුවත් 2012 අගෝස්තු මස 22 වන දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේදී, කෙටි කාලීන අතිරික්ත අරමුදල් සත් දින කැඳවුම් තැන්පතු වල ආයෝජනය කරනවා වෙනුවට යම් කොටසක් වැඩි පොළී ආදායමක් ලැබීම සඳහා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන මෙන් උපදෙස් ලැබී ඇත. (රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභා රැස්වීම් සටහන් වල පිටපතක් අංක ආර්ටී/බී/එන්ටීසී/එෆ්ඒ/2012/22 දරන විමසුමට පිළිතුරු සමග විගණනය වෙත ඉදිරිපත් කර ඇත.)

එයට අමතරව තාවකාලික අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය වෙත 2019.02.07 දිනැතිව ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර මේ දක්වා එයට පිළිතුරක් ලැබී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සියලුම වාහන සඳහා වාහන අළුත්වැඩියා, සේවා, රක්ෂණ වශයෙන් වෙන් වෙන්ව ක්‍රමාණුකූලව ලිපිගොනු පවත්වාගෙන යනු ලබන අතර ඒ ඒ වාහනය සඳහා දෛනික ධාවන සටහන් (Daily Running Chart) නිසි පරිදි පවත්වාගෙන යනු ලබයි. එම ධාවන සටහන් පොත් වාහන භාර නිලධාරියා විසින් පරීක්ෂා කර බලන නමුත් වාහන සඳහා ලොග් සටහන් පොත් පවත්වාගෙන නොගිය අතර ඉදිරියේදී ලොග් සටහන් පොත් නඩත්තු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඈ) 2022.06.04 දින පවත්වන්නට යෙදුන ප්‍රවාහන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් කෙටි කාලීන ක්‍රියාමාර්ග සඳහා වන වැඩමුළුව වෙනුවෙන් වැය කරන ලද මුදල රු. 427,575.00 කි. එම වියදම දැරීම සඳහා 198,250.00 ක දායකත්වයක් දක්වන මෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් දැනුම් දෙන ලද අතර එම ගෙවීම් සිදු කිරීම ප්‍රවාහන අමාත්‍යාංශයේ අංක.MT/02/01/01/24 හා 2022.08.17 දිනැති ලිපිය අනුව සිදු කරන ලද බව කාරුණිකව දැනුම් දෙමි. (ඇමුණුම 01)

2021 සහ 2022 වර්ෂ වල ප්‍රවාහන අමාත්‍යධුරය දරන ලද හිටපු ගරු ප්‍රවාහන අමාත්‍ය , පවිත්‍රා වන්නිආරච්චි මැතිනියගේ නිළ නිවසේ ආරක්ෂාව වෙනුවෙන් 2021 අගෝස්තු 19 වන දින සිට ආරක්ෂක නිළධාරියකු යොදවන ලෙස ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් වාචිකව සභාපතිතුමා වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ඒ සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය NTC/AD/MOT/2020/01 අංක දරන හා 2021.12.01 දිනැති ලිපියෙන් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලා සිටින ලද අතර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MT/01/12/17 අංක දරණ හා 2022.01.28 දිනැති ලිපියෙන් අනුමැතිය ලැබී මෙන් අනතුරුව

අදාල ගෙවීම් 2022 මාර්තු දක්වා වූ මාස 08ක කාලයක් සඳහා ගෙවීම් සිදු කර ඇත. අදාල අනුමැතිය ලද ලිපිය මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 02) මෙහිදී වියදම් පාලනය කිරීමේ පියවරක් වශයෙන් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා යොදවා තිබූ ආරක්ෂක නිළධාරීන්ගෙන් එක් අයෙකු අඩුකර නිළ නිවසේ ආරක්ෂාවට යොදවන ලද බැවින් අදාළ නිළ නිවසේ ආරක්ෂාව වෙනුවෙන් අමතර පිරිවැයක් නොදරණ ලදී.

2.2.4

(අ) 2021/11/26 වන දින මෙම GPS උපකරණ 500 ලැබුණද ඒවායෙන් දත්ත සම්ප්‍රේෂණ පහසුකම් සපයා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත කිරීමට සිදුවිය. නමුත් මේ වන විට මෙම උපකරණ බස්රථ වල සවිකිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

2.3 වෙනත් කරුණු

(අ) ජාතික ගමනාගමන කොමිෂන් පනත සංශෝධනය කිරීම නීති කෙටුම්පත දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර පනත සංශෝධනයට අදාල කාර්යයන් දැනට සිදු කෙරෙමින් පවතී.

(ආ) ගැමි සැරිය ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂය දක්වා වලංගුව පැවති සේවා ගිවිසුම් අනුව ධාවනය ආරම්භ කළයුතු සේවා ගණන 12කි. ගිවිසුම් අත්සන් කළද ධාවනය ආරම්භ කර ගෙවීම් සඳහා ලොග්පත්‍ර ඉදිරිපත් කරන ලද සේවා ගණන 09කි. (ඇමුණුම් අංක 03)

ඒ අනුව 2022 වර්ෂය වන විට ධාවනය ආරම්භ කර සහනාධාර ලබමින් පැවති සේවා සංඛ්‍යාව 9ක් වන අතර එම සේවා නවය පවත්වා ගෙන යාමට හා 2022 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කළ නව සේවා 40ක් සඳහා ගෙවීම් කිරීමට 2022 වර්ෂයට වෙන් කරන ලද මුදල රු. මි. 14.89 කි. (ගැමි සැරිය ව්‍යාපෘතිය යටතේ ධාවන කි.මී.1කට උපරිම සහනාධාර මුදල රු. 38/- ක් ගෙවීම පදනම් කර ගනිමින්)

ඒ අනුව, 2022 වර්ෂයේ මැයි මස වන විට නව ගැමි සැරිය සේවා ආරම්භ කිරීම සඳහා මගී ඉල්ලුම් සමීක්ෂණ සිදු කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද සේවා ගණන 5කි. (ඇමුණුම් අංක 04)

නමුත් 2022 වර්ෂයේ ඉන්ධන මිල කිහිප වතාවක් අඛණ්ඩව ඉහළ යාම සහ බස්රථවල මිල, ඊට යොදවන අමතර කොටස්වල මිල ගණන් රක්ෂණ, පොලී අනුපාත සහ සේවක වැටුප් අධික ලෙස වැඩි වීම නිසා පහත සඳහන් පරිදි බස්රථවල කි.මී 1ක ධාවන පිරිවැය වැඩි වැඩි වූ හෙයින් එම වැඩි වීම අනුව අංක අමප/18/0957/808/008 දරණ 2018.05.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ලැබී ඇති අනුමැතිය අනුව ගැමි සැරිය සේවා සඳහා ගෙවනු ලබන සහනාධාර පහත ආකාරයෙන් සංශෝධනය කළ යුතු විය.

දිනය	කි.මී. 1ක ධාවන පිරිවැය	ගැමි සැරිය කි.මී. 1කට ගෙවන උපරිම මුදල
2022.01.05	රු.123.62	රු. 41.00
2022.03.15	රු. 140.56	රු. 47.00
2022.04.19	රු. 175.36	රු. 58.00
2022.05.24	රු. 209.54	රු. 70.00
2022.07.01	රු. 276.79	රු. 92.00
2022.07.18	රු. 270.63	රු. 90.00
2022.08.05	රු. 267.55	රු. 89.00

2022 වර්ෂයේදී සමාජ සුබසාධනය මූලික කරගත් ව්‍යාපෘති සඳහා ජාතික අයවැයෙන් වෙන් කරන ලද රු.මි. 900ක මුදලින් (2022 ජාතික අයවැයෙන්රු.මි.650ක් වෙන් කරන ලද අතර 2022 අතුරු අයවැයෙන් එම මුදල රු.මි. 900 දක්වා වැඩි කරන ලදී) රු.මි. 14.89ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරනු ලැබුයේ කි.මී. 1කට රු.38/-ක උපරිමයකට යටත්ව ගෙවීම් කිරීමට වන අතර ඉහත ආකාරයෙන් 2022.04.19 දින කි.මී. 1ක පිරිවැය අනුව කි.මී.1කට රු.58/- බැගින් ගෙවීම් කිරීමට තීරණය වූ බැවින් 2022 වර්ෂය සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවීය.

මෙම කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගැමිසැරිය ව්‍යාපෘතිය යටතේ කිසිදු ආකාරයකින් නව සේවා ආරම්භ කිරීම තාවකාලිකව නතර කිරීමට කටයුතු කරන ලෙසටත් මේ වන විට පවත්වා ගෙන යන සේවාවන් මෙතෙක් කරන ලද ගෙවීම් ක්‍රමවේදයට යටත්ව ගෙවීම් සිදු කරමින් පවත්වාගෙන යන ලෙසටත් 2022.05.05 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ අංක 59/2022 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අනුමැතිය ලබා දෙන ලදි.

එහෙයින් 2022.05.05 දින වන විට ආරම්භ කිරීමට සැලසුම් කළ ඇමුණුම් අංක 02 සමඟ අමුණා ඇති ලේඛනයේ සඳහන් නව සේවා 5 ආරම්භ කිරීම සහ ඉතිරි නව සේවා හඳුනා ගැනීමට සමීක්ෂණ සිදු කිරීම අත්හිටුවන ලදි.

(ඇ) 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මකව පැවති නිසි සැරිය සේවා ගණන 191කි. 2022 වර්ෂය තුළ නව නිසි සැරිය සේවා 25ක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. (ඇමුණුම් අංක 05)

2022 වර්ෂය වන විට ක්‍රියාත්මකව පැවති නිසිසැරිය සේවා 191 කි.මී 1කට රු. 19/- බැගින් සහනාධාර ගෙවමින් පවත්වා ගෙන යාම සහ නව නිසිසැරිය සේවා 100ක් ආරම්භ කිරීම සඳහා ජාතික අයවැයෙන් වෙන් කරන ලද රු.මි. 900ක මුදලින් (2022 ජාතික අයවැයෙන්රු.මි.650ක් වෙන් කරන ලද අතර 2022 අතුරු අයවැයෙන් එම මුදල රු.මි. 900 දක්වා වැඩි කරන ලදී)වෙන් කරන ලද මුදල රු.මි. 34.53කි. නමුත් 2022 වර්ෂයේ ඉන්ධන මිල කිහිප වතාවක් අඛණ්ඩව ඉහළ යාම සහ බස්රථවල මිල, ඊට යොදවන අමතර කොටස්වල මිල ගණන් රක්ෂණ,

පොලී අනුපාත සහ සේවක වැටුප් අධික ලෙස වැඩි වීම නිසා පහත සඳහන් පරිදි බස්රථවල කි.මී 1ක ධාවන පිරිවැය වැඩි වැඩි වූ හෙයින් එම වැඩි වීම අනුව අංක අමප/18/0957/808/008 දරණ 2018.05.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ලැබී ඇති අනුමැතිය අනුව නිසි සැරිය සේවා සඳහා ගෙවනු ලබන සහනාධාර පහත ආකාරයෙන් සංශෝධනය කළ යුතු විය.

දිනය	කි.මී. 1ක ධාවන පිරිවැය	නිසි සැරිය කි.මී. 1කට ගෙවන උපරිම මුදල
2022.01.05	රු. 123.62	රු. 21.00
2022.03.15	රු. 140.56	රු. 23.00
2022.04.19	රු. 175.36	රු. 29.00
2022.05.24	රු. 209.54	රු. 35.00
2022.07.01	රු. 276.79	රු. 46.00
2022.07.18	රු. 270.63	රු. 45.00
2022.08.05	රු. 267.55	රු. 45.00

ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 34.53ක් වෙන් කරන ලද්දේ රු.19/- බැගින් කි.මී.1කට සහනාධාර ගෙවීමට වන අතර ඉහත ආකාරයෙන් 2022.04.19 දින කි.මී. 1ක පිරිවැය අනුව කි.මී. 1කට රු.29/- බැගින් ගෙවීම් කිරීමට තීරණය වූ බැවින් 2022 වර්ෂය සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවීය.

මෙම කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසිසැරිය ව්‍යාපෘතිය යටතේ නව සේවා ආරම්භ කිරීම තාවකාලිකව නතර කිරීමට කටයුතු කරන ලෙසටත් මේ වන විට පවත්වා ගෙන සේවාවන් මෙතෙක් කරන ලද ගෙවීම් ක්‍රමවේදයට යටත්ව ගෙවීම් සිදු කරමින් පවත්වාගෙන යන ලෙසටත් 2022.05.05 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ අංක 59/2022 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අනුමැතිය ලබා දෙන ලදි.

එහෙයින් 2022.05.05 දින වන විට ආරම්භ කිරීමට සැලසුම් කළ නව සේවාවන් සඳහා නිසිසැරිය ව්‍යාපෘතිය යටතේ ගිවිසුම් ගත වීම අත්හිටුවන ලදි.

(ඇ) උක්ත විගණන විමසුමෙහි සඳහන් 'මාර්ග ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ 14ක් සඳහා රු.5,000,000ක් වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණ 17ක් සිදුකර තිබුණි' යන්න ,'මගී ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ 17ක් සඳහා රු.5,000,000ක් වෙන්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණ 14ක් සිදුකර තිබුණි' ලෙස නිවැරදි විය යුතු බව කාරුණිකව දන්වමි.(2022 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අමුණා ඇත.-ඇමුණුම් අංක 06)

2022 වර්ෂයේ සමීක්ෂණ 17ක් සැලසුම් කළ නමුත්,

- 2022 වර්ෂයේ ඇතිවූ ඉන්ධන අර්බුදය හේතුකොටගෙන අන්තර්පළාත් බස්රථ අඛණ්ඩව ධාවනය නොවීමත්
- එහෙයින්, සැලසුම් කළ සමීක්ෂණ සිදු කිරීම මගින් අපේක්ෂිත නියමාකාර දත්ත ලබාගත නොහැකි වීමත් එම දත්ත අනුසාරයෙන් නිවරදි තීරණ වලට එළඹීමට නොහැකි වීමත් නිසා සැලසුම් කළ සමීක්ෂණ සියල්ල සිදු නොකරන ලදී

නමුත්, ඉන්ධන අර්බුදය තුළද මගියාට අවහිරයකින් තොරව හැකි උපරිම මට්ටමින් අන්තර්පළාත් බස්රථ සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය වන තීරණ ගැනීමට පමණක් සමීක්ෂණ සිදු කරන ලදී.

තවද 2022.08.08 දිනැති අංක 04/2022 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සීමාකිරීම සිදු කරන ලද හෙයින් අත්‍යවශ්‍ය සමීක්ෂණ පමණක් සිදු කිරීමට තීරණය කළ නිසා 2022.12.31 දින වන විට සමීක්ෂණ 14 ක් පමණක් සිදුකරන ලදි.

උක්ත චක්‍රෙල්ඛය අනුව මෙම සමීක්ෂණ සිදු කිරීමේදි මුදල් අවම වශයෙන් භාවිත වන පරිදි,

- සාමාන්‍ය රාජකාරි කටයුතු වලට බාධා නොවන පරිදි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිලධාරීන්ම යොදවා ගනිමින් සමීක්ෂණ දත්ත රැස්කිරීම සිදු කිරීම(විශ්ව විද්‍යාල සිසුන් වෙනුවට)
- සමීක්ෂණ දත්ත රැස් කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීම

ආදී ක්‍රම උපයෝගී කර ගැනීම මගින් වෙන් කරන ලද මුදල අවම වශයෙන් භාවිතා කරන ලද බව කාරුණිකව දන්වමි.

2022 වර්ෂයේ මාර්ග ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 5.0ක් වෙන්කර තිබූ අතර ඉන් රු 2,568,180.00ක් වැය කර සමීක්ෂණ 14ක් සිදුකරන ලදී.

2022 වර්ෂයේ බස් පර්යන්තවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 5.70ක් වෙන්කර තිබූ අතර එම මුදලින් රු, 2,621,665.00ක් එම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. ඒ අනුව මෙම විගණන විමසුමේ සඳහන් පරිදි අරමුණු ගත කාරණයෙන් බැහැරව බස්රථ පර්යන්ත වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වන රු.2,621,665.00 මාර්ග ඉල්ලුම් හා සේවා තත්ත්ව සමීක්ෂණ ව්‍යාපෘතිය සඳහා වෙන්කරනලද මුදලින් වියදම් කර නොමැති අතර එම මුදල් වියදම් කර තිබුණේ බස් පර්යන්ත වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ව්‍යාපෘතිය සඳහා වෙන් කරනලද රු.මි. 5.70 ක මුදලින් වේ.

(ඉ) 57-4195 අංක දරණ වැන්රථය 1995 වර්ෂයේ මිලදී ගෙන ඇති අතර අවසන් වරට 2018, 2019 , 2020, 2021 වර්ෂ වල ධාවනය පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු සඳහා වියදම් දරා ඇත. එහෙත් 2022 වර්ෂය තුල මෙම වාහනයේ අළුත්වැඩියා වෙනුවෙන් කිසිඳු වියදමක්

දරා නොමැත. මෙම වාහනය 2021 මැයි දක්වා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ රාජකාරී කටයුතු සඳහා ධාවනයට යොදවා ඇත. 2021 මැයි මස සිට එහි අධික දුම් පිටවීම මත එන්ජින් පද්ධතියේ ඇති වූ දෝෂයක් සම්බන්ධයෙන් අළුත්වැඩියාවක් සිදු කිරීමට අවශ්‍යව තිබුණද ආයතනයේ හා රටෙහි පැවති ආර්ථික අර්බුදය හමුවේ හා රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍ර ලේඛන වලට අනුව එම අළුත්වැඩියාව සිදු නොකරන ලදී.

මේ වන විට මෙම වාහනය මිලදී ගෙන වසර 25ක් ඉක්මවා ඇති අතර මෙම වාහනයේ හට ගන්නා දෝෂ හේතුවෙන් තවදුරටත් අලුත්වැඩියාවන් වෙනුවෙන් ආයතනය විසින් වියදම් දරනවාද නැතහොත් වෙනත් විලක්පයක් කරා යොමු වීම සුදුසුද යන්න තීරණය කිරීම සඳහා විද්වත් කමිටුවක් මගින් නිර්දේශයක් ලබාගැනීමත් ඒ අනුව කටයුතු කිරීමටත් මේ වන විටත් පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

ශශී වෙල්ගම
සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ඇමුණුම 01





ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள்அமைச்சு
MINISTRY OF TRANSPORT AND HIGHWAYS

මගේ අංකය / எனது இல. / My No. NTC MT/02/01/01/24

ඔබේ අංකය / உமது இல. / Your No. NTC/F/CF/2022/430

දිනය / திகதி / Date 2022.08.17

සභාපති
ජාතික ගමනා ගමන කොමිෂන් සභාව

ප්‍රවාහන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් කෙටිකාලීන ක්‍රියාමාර්ග සඳහා වන වැඩමුළුව - 2002.06.04

උක්ත කරුණට අදාලව ඔබ විසින් මා වෙත එවන ලද ... අංක හා 2022.07.29 දිනැති ලිපිය හා බැඳේ.2021 වර්ෂයේ ඔබ ආයතනයේ වියදම් පිළිබඳව විගණකාධිපති වාර්තාව හා 2003.06.02 දිනැති රාජ්‍ය වාණිජ වක්‍රලේඛය මැනවින් අධ්‍යයනය කරන ලෙස කාරුණිකව දන්වමි.ඒ අනුව පොදු මගී බස්රථ සේවාවද ඇතුලත්ව ප්‍රවාහන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් රු.198,250.00 ක මූදල ජාතික ගමනා ගමන කොමිෂන් සභාව විසින් දැරීමට කිසිදු බාධාවක් නැති බව නැවත දන්වමි.

02.ඒ අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වශයෙන් අමාත්‍යාංශ ලේකම්තුමා ලබාදී ඇති අනුමැතිය අනුව ක්‍රියා කාර්ය ලෙස නැවත දන්වමි.

බර්නාඩ් වසන්ත
අතිරේක ලේකම් (සංවර්ධන)
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශ
ලේකම් වෙනුවට

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය(ප්‍රවාහන අංශය),07 වෙනි මහල,සෙත්සිරිපාය අදියර ii, බත්තරමුල්ල.
போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள்அமைச்சு,போக்குவரத்துப் பிரிவு,07ஆவதுமாடி, செத்சிறிபாய, IIஆம்கட்டம், பத்தரமுல்லை...

අමුණුම 02

PAGE 01

MINISTRY OF AVIATION

ALL Ms. Sugitha

(1)

07 වෙනි මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල
07 ஆவது மாடி, செத்சிரிபாய, II ஆம்கட்டம், பத்தரமுல்லை
7th Floor, Sethsiripaya Stage II, Battaramulla

අමාත්‍ය අංශය
இணையத்தளம்
Website
www.transport.gov.lk

රාජකාරී දුරකථන Telephone

ඇමතිවරයා அமைச்சர் Minister 2187225
ලේකම් செயலாளர் Secretary 2187233
කාර්යාලය அலுவலகம் Office 2187200, 2187201
ෆැක්ස් பெக்ஸ் Fax 2865093, 2187226
විද්‍යුත් තැපෑල් மின்னஞ்சல் E-Mail secmintransport@gmail.com

මගේ අංකය எனது இல My No MT/01/12/17
ඔබගේ අංකය உமது இல Your No NTC/AD/MOT/2020/01
දිනය திகதி Date 2022.01.28

යහපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

ආරක්ෂක නිළධාරියෙකු සේවයේ යෙදවීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2021/12/01 දිනැති ලිපිය හා බැඳේ.

02.ඒ අනුව ගරු අමාත්‍යතුමියගේ ඉල්ලීම මත ගරු අමාත්‍යතුමියගේ ජාවත්තේ පිහිටි නිල නිවාසයේ ආරක්ෂාව සඳහා ඔබ ආයතනයේ ආරක්ෂක නිළධාරියකු සේවය යෙදවීමට 2021/08/09 දින සිට මෙයින් අනුමැතිය ලබාදෙන බව කාරුණිකව දන්වා සිටිමි.

ඒ.එම්.ආර්.පේ.කේ.ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)

අක්/කලේ : එන්.බී.එම්.රණතුංග
ලේකම්

(2) ADCAdmn)
NAP.
28/1

(3) to
The
28/01/22

Ms. Damayanthi
Plo. F.N.A.

True Copy
S. S. Agampola
Administrative Officer
National Transport Commition

ගැම් සැරිය ව්‍යාපෘතිය

ඇමුණුම් 03

	නම	සේවා අංකය	බස්රථ අංකය	සිට	දක්වා	ගිවිසුම්ගත දිනය	ගිවිසුම අවලංගු වන දිනය	සේවා නොලබන දුර	එකඟ වූ මුදල
1	ආර්.එල්. සඳමාලි විජේරත්න	NTC/PL/GS/NWP/2018 (iii)	60-7944	නාගසෝලේ	නිකවැරටිය	07.01.2019	06.01.2022	18	25.00
2	එච්.එම්. රත්බණ්ඩා	NTC/PL/GS/NWP/2018 (iv)	61-1126	නිකවැරටිය	රස්නායකපුර	08.03.2019	07.03.2022	10.5	14.50
3	ඩබ්.එම්. ඉන්ද්‍රසේන	NTC/PL/GS/EP/2019-1	NB-8493	කෙම්බලපිටිය	පදියතලාව	19.08.2019	18.08.2022	9.7	37.8
4	සිවරජනී රවිකුමාර්	NTC/PL/GS/EP/2019-II	NA-2196	ඔම්නියාමඩු	වාලච්චේන	26.08.2019	25.08.2022	9.6	37.8
5	කේ.ජී. සුගත් සුසන්ත	NTC/PL/GS/EP/2019-III	ND-8531	9 කොලනිය	කින්නියා	27.08.2019	26.08.2022	13.3	37.75
6	අයි.ජී. ප්‍රදීප් සම්පත්	NTC/PL/GS/EP/2019-IV	NB-0450	දිවුල්ගස්වැව	කන්තලේ	27.08.2019	26.08.2022	8.5	37.9
7	පී. රවීචන්ද්‍රන්	NTC/PL/GS/EP/2019-V	NC-8978	චෙන්කලඩි	මියන්කුලම	28.08.2019	27.08.2022	23	37.9
8	එස්.එම්.එම්. රාෂික්	NTC/PL/GS/EP/2019-VI	JU-3329	තිරුමාල්පුරම්	ත්‍රිකුණාමලය	18.09.2019	17.09.2022	5.7	37.07
9	එන්.එච්.එම්.ආර්. අනෝමා කුමාරි	NTC/PL/GS/EP/2019-VII	HG- 5724	හුලංබදනාගල	දෙහිඅත්තකණ්ඩිය	24.09.2019	23.09.2022	7.4	37.75
10	කේ.ජී. කමලානි	NTC/PL/GS/EP/2019-VIII	62-1357	මුවසිරිගම	මහඔය	30.09.2019	29.09.2022	11	37.95
11	වී කහනාදන්	NTC/PL/GS/EP/2019-IX	62-9238	තණ්ඩමලේ	කොක්අඩිවෝලේ	20.12.2019	19..12.2022	16.9	37.90
12	ජී.පී. අමරසේන	NTC/PL/GS/EP/2019-X	62-8564	සඳුන්පුර	දෙහිඅත්තකණ්ඩිය	13.01.2020	12.01.2023	12.9	37.85

ගැම් සැරිය ව්‍යාපෘතිය

	නම	සේවා අංකය	බස්රථ අංකය	සිට	දක්වා	ගිවිසුම්ගත දිනය	ගිවිසුම අවලංගු වන දිනය	සේවා නොලබන දුර	එකඟ වූ මුදල
1	ඩබ්.එම්. ඉන්ද්‍රසේන	NTC/PL/GS/EP/2019-1	NB-8493	කෙම්බලපිටිය	පදියතලාව	19.08.2019	18.08.2022	9.7	37.8
2	කේ.ජී. සුගත් සුසන්ත	NTC/PL/GS/EP/2019-III	ND-8531	9 කොලනිය	කින්නියා	27.08.2019	26.08.2022	13.3	37.75
3	අයි.ජී. ප්‍රදීප් සම්පත්	NTC/PL/GS/EP/2019-IV	NB-0450	දිවුල්ගස්වැව	කන්තලේ	27.08.2019	26.08.2022	8.5	37.9
4	පී. රවීචන්ද්‍රන්	NTC/PL/GS/EP/2019-V	NC-8978	චෙන්කලඩි	මියන්කුලම	28.08.2019	27.08.2022	23	37.9
5	එස්.එම්.එම්. රාෂික්	NTC/PL/GS/EP/2019-VI	JU-3329	තිරුමාල්පුරම්	ත්‍රිකුණාමලය	18.09.2019	17.09.2022	5.7	37.07
6	එන්.එච්.එම්.ආර්. අනෝමා කුමාරි	NTC/PL/GS/EP/2019-VII	HG- 5724	හුලංබදනාගල	දෙහිඅත්තකණ්ඩිය	24.09.2019	23.09.2022	7.4	37.75
7	කේ.ජී. කමලානි	NTC/PL/GS/EP/2019-VIII	62-1357	මුවසිරිගම	මහඔය	30.09.2019	29.09.2022	11	37.95
8	වී කහනාදන්	NTC/PL/GS/EP/2019-IX	62-9238	තණ්ඩමලේ	කොක්අඩිවෝලේ	20.12.2019	19..12.2022	16.9	37.90
9	ජී.පී. අමරසේන	NTC/PL/GS/EP/2019-X	62-8564	සඳුන්පුර	දෙහිඅත්තකණ්ඩිය	13.01.2020	12.01.2023	12.9	37.85

ඇමුණුම් 04

අනු අංකය	පළාත	මාර්ගය	මාර්ගයේ මුළු දුර කි.මී.	සේවා නොලබන දුර කි.මී
01	නැගෙනහිර	කොක්අඩිචෝලේ - පන්චේන	18.3	14.7
02	නැගෙනහිර	කිරාන් - මුරුකාතෙන	16.4	3.8
03	ඌව	මිදෙනිය -වැල්ලවාය	15.3	6.2
04	ඌව	මිගහපිටිය - මොනරාගල	32.3	13.3
05	දකුණ	ඌරුබොක්ක-කැකුන්දෙනිය-කැටවල-තලවත්ත-මහදොල	-	9.5

ඇමුණුම් 05

	ගිවිසුම්ගත දිනය	ඩිපෝව	සේවා අංකය	සේවාව
1	2022.02.02	මහියංගනය	NS/2022/UVA/MY/105	මහියංගනය සිට කෙසෙල්පොත
2			NS/2022/UVA/MY/105-1	කෙසෙල්පොත සිට මහියංගනය
3			NS/2022/UVA/MY/106	මහියංගනය සිට දිවුලපැලැස්ස
4			NS/2022/UVA/MY/106-1	දිවුලපැලැස්ස සිට මහියංගනය
5	2023.03.08	බලංගොඩ	NS/2022/SAB/BG/107	බලංගොඩ සිට උණවැල්ල
6			NS/2022/SAB/BG/107-1	උණවැල්ල සිට බලංගොඩ
7			NS/2022/SAB/BG/108	බලංගොඩ සිට මාරකැන්න
8			NS/2022/SAB/BG/108-1	මාරකැන්න සිට බලංගොඩ
9			NS/2022/SAB/BG/109	බලංගොඩ සිට පඹහින්න
10			NS/2022/SAB/BG/109-1	පඹහින්න සිට බලංගොඩ
11	2023.03.09	ගාල්ල	NS/2022/S/GL/110	ගාල්ල සිට යක්කලමුල්ල
12			NS/2022/S/GL/110-1	යක්කලමුල්ල සිට ගාල්ල
13		කැප්පෙට්පොළ	NS/2022/UVA/KPP/111	වැලිමඩ සිට උඩපේරුව
14	2023.03.24	නිට්ටඹුව	NS/2022/W/NT/112	නිට්ටඹුව සිට කිරිඳිවැල
15			NS/2022/W/NT/112-1	කිරිඳිවැල සිට නිට්ටඹුව
16	2023.03.25	හෝමාගම	NS/2022/W/HG/113	පාදුක්ක සිට පනංගල
17			NS/2022/W/HG/113-1	පනංගල සිට පාදුක්ක
18			NS/2022/W/HG/114	පාදුක්ක සිට වග
19			NS/2022/W/HG/114-1	වග සිට පාදුක්ක
20	2023.04.25	හලාවත	NS/2022/NW/CH/108	කුරුණෑගල සිට හෙට්ටිපොල
21			NS/2022/NW/CH/108-1	හෙට්ටිපොල සිට කුරුණෑගල
22	2023.04.29	කංගල්ල	NS/2022/S/TG/116	කංගල්ල සිට වලස්මුල්ල
23			NS/2022/S/TG/116-1	වලස්මුල්ල සිට කංගල්ල
24			RBC/NS/12	කිරින්ද සිට කංගල්ල
25			RBC/NS/10	වලස්මුල්ල සිට කංගල්ල

Objective : To fulfil customer satisfaction by providing reliable and people friendly transport service for passenger and freight

No	Project Name	Activity	Allocation 2022 (Rs. Mn)	Milestones 2022 (Rs.Mn)					Expected Output / Target	Activity Revision 2022	Revised Allocation 2022 (Rs. Mn)	Milestones 2022 (Rs.Mn)					Revised Expected Output / Target	KPI	Responsibility	Remarks (if any)
					Q1	Q2	Q3	Q4					Q1	Q2	Q3	Q4				
4	Reform of the Private Bus Industry (a)	**Operation & Maintenance of bus Terminal**	9.000	F(Tr)					conduct 24 mobile services & 9 Work shops	**Operation & Maintenance of bus Terminal**	5.700	F(Tr)					conduct 12 mobile services & 2 Work shops	No.of mobile servicers conducted No. of operated buses with new specipications	Director (Operation)	Contribution of SLTB and PTAs
		1. Mobile Service for Inspection of Bus Specifications		F(NTC)	1.9	6	7.7	9		1. Mobile Service for Inspection of Bus Specifications		F(NTC)	2.142		3.692	5.700				
		2. Workshop for the officials of PTAs regarding awareness of Bus specifications								2. Workshop for the officials of PTAs regarding awareness of Bus specifications										
		3.Special Functions &New Year services, Maintenance of Resting places I BM		P	20%	50%	75%	100%		3.Special Functions &New Year services, Maintenance of Resting places I BM		P	Act.1 - 8.3% Act.3 - 100%		Act.1, 3,4,5	Act.1,2 ,3,4,5				
		4.Maintanance of Matara Highway Bus stand								4.Maintanance of Matara Highway Bus stand										
		5.Other expences for Bus stand repaires								5.Other expences for Bus stand repaires										
		6.Administration Work								6.Administration Work										

Objective : To increase average vehicle utility for public bus services in order to fulfill passenger demand

No	Project Name	Activity	Allocation 2022 (Rs. Mn)		Milestones 2022 (Rs.Mn) Q1	Q2	Q3	Q4	Expected Output / Target	Activity Revision 2022	Revised Allocation 2022 (Rs. Mn)		Milestones 2022 (Rs.Mn) Q1	Q2	Q3	Q4	Revised Expected Output / Target	KPI	Responsibility	Remarks (if any)
5	Reform of the Private Bus Industry (b)	**Traffic Demand & Service Condition Surveys**	22.500	F(Tr)					50 surveys	**Traffic Demand & Service Condition Surveys**	5.000	F(Tr)					17 surveys	No. of surveys Conducted	Director (Planning)	
		1. Conduct Surveys for - i. Surveys for new routes (Including 'Gemi Seriya')		F(NTC)	5.5	11	16.5	22.5		1. Conduct Surveys for - i. Passenger demand surveys		F(NTC)	0.975		2.988	5				
		ii. Passenger demand surveys																		
		iii. Quality Improvement surveys								iii.Transport Planning surveys										
		iv. Transport Planning surveys																		
		2. Data Entering, Analysing and writing report		P	25%	50%	75%	100%		2. Data Entering, Analysing and writing report		P	11 surveys (22%)		8	9				
		3. Forward for dissision making								3. Forward for dissision making										
		4. Administration work								4. Administration work										
6	Quality & Fare regulation (b)	**Time Tables & Service Monitoring**	1.000	F(Tr)					Preparation of All interprovinial bus routes starting with the Western Province	**Time Tables & Service Monitoring**	0.200	F(Tr)					Revision of time tables for interprovincial routes on passenger demand	No of implemented intergrated time tables	Director (Planning)	Depend on SLTB contribution
		1. Preparation & Ammendments of bus time tables for all interprovincial routes start with the Western Province.		F(NTC)	0.25	0.5	0.75	1		1. Revision of bus time tables for interprovincial routes on passenger demand		F(NTC)	0.004		0.102	0.2				
		2. Coordination with provincial transport authorities(Mobile service meeting & monitoring activities)		P	25%	50%	75%	100%		2.Administration work		P	30%		40%	40%				
		3.Administration work																		